වාර්ෂික වාර්තාව සහ
වාර්ෂික මූල්‍ය ප්‍රකාශන
2022

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

දැක්ම

ගෝලීය සන්දර්භය තුළ අභිවර්ධනීය සමාජයක සංවර්ධනයෙහි ලා මානව කුසලතා සංවර්ධනයට ඉගෙනුම්, ඉගැන්වීම් සහ පර්යේෂණ දායකත්වයේ විශිෂ්ටතම මධ්‍යස්ථානය බවට පත් වීම.

මෙහෙවර

මානව සම්පත සංවර්ධනයට, අති නවීන තාක්ෂණයන් සහ ක්‍රමවේද උපයෝග කොට ගනිමින් දක්ෂ මෙන්ම මනාව කැපවූ කාර්ය මණ්ඩලයක් හරහා නායකත්වයේ තරගකාරී සංවර්ධනය, ව්‍යවසායකත්වය, සහ විවේචනාත්මක චින්තන හැකියාවන් සමග උසස් සමාජ සදාචාර ප්‍රමිතීන් ඉලක්කකොට අනේකවිධ කළමනාකරණ, කළමනාකරණ-නොවන රැකියා නියුක්තිකයන් සහ ව්‍යවසායකයින් උදෙසා ජාතික වශයෙන් තරගකාරී සහ ජාත්‍යන්තරව පිළිගත් ඉගෙනුම්, පර්යේෂණ සහ සංවර්ධන අවස්ථා සම්පාදනය කිරීම.

වටිනාකම්

වටිනාකම 01 - අධ්‍යාපනයේ නිදහස

විධිමත් උසස් අධ්‍යාපන අධ්‍යයන අවස්ථා අහිමිව සේවයේ නියුක්තව සිටින කළමනාකාරී නොවන සේවා නියුක්තිකයින් උදෙසා නිදහස් අධ්‍යාපනය අඛණ්ඩව සම්පාදනය කරන අතරම, උසස් අධ්‍යාපනික අවස්ථා පූරණය කර ගැනීමට නොහැකිවූ කළමනාකාරී සේවා නියුක්තිකයන්, සහ වෘත්තිකයන් සංවර්ධනය කිරීම අපි අගය කරමු.

වටිනාකම 02 - අභිවර්ධනීය චින්තනය

එකිනෙකාගේ කාර්යභාරය උපරිම කැපවීමකින් සිදු කරමින් අපගේ සාමූහික ප්‍රයත්නයේ ප්‍රතිඵල සාධාරණාත්මකව බෙදා ගනිමින් සහ අප ළඟා කරගත් දේ මානව සම්පත් අභිවර්ධන ආයතනය තුළ හා ඉන් පිටත අනාගත පරපුරට තිරසාරව පවත්වා ගනිමින් සහ දියුණු කරමින් සමාජයේ අභිවර්ධනය සඳහා සාමූහිකව කටයුතු කිරීම අපි අගය කරමු.

වටිනාකම 03 - විවිධත්වය හා අන්තර්ගතය

අප විවිධත්වය අගය කරනවා පමණක් නොව, අපගේ ආයතනය සහ සමාජය විසින් විවිධත්වයන් ප්‍රතිලාභ ලබා ගැනීම සහතික කිරීම උදෙසා අපගේ සාරධර්ම, විශ්වාස, පසුතල, කුසලතා සහ කාර්ය දිශානතියෙහි වෙනස්කම් පිළිගෙන ප්‍රවර්ධනය කරන අන්තර්ග්‍රහණීය කාර්ය සංස්කෘතියක් අපි අගය කරමු.

වටිනාකම 04 - ප්‍රජාවගේ ජීව ගුණය

එකම අරමුණක් පෙරදැරි කොට ඒකීය අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීම වෙනුවෙන් ඒකීය ප්‍රජාවක් ලෙස "මම" නොව "අප" යන ගුණය ගොඩ නැගීමට හේතු පාදක වන අභිලාෂයන්ගෙන් යුක්තවන්නා වූ මානව ප්‍රජාවක් බවට පත්වීමට කටයුතු කිරීම අපි අගය කරමු.

වටිනාකම 05 - අප සිදු කරන දෑ පවරා දීම

මානව සම්පත් අභිවර්ධන ආයතනික ප්‍රජාවගේ සහ ඉන් පරිබාහිර ප්‍රජාවගේද සදාචාරාත්මක නිවැරැදි පැවැත්ම අප දිරිගන්වනු ලබන අතර දැනුම සහ තොරතුරු එක් රැස් කිරීමේ අසීමාන්තික අයිතිය උසස් අධ්‍යාපන ඉගෙනුම් සම්පාදන ආයතනයක් පවත්වා ගත යුතු රහස්‍යභාවය තහවුරු කරමින් පවත්වාගෙන යාම අපි අගය කරමු.

අධ්‍යක්ෂවරයාගේ සමාලෝචනය



මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2022 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව සහ වාර්ෂක මූල්‍ය ප්‍රකාශනය සඳහා පූර්ණ සමාලෝචනයක් ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම අතිශයින්ම සතුටට පත් වෙමි. පසුගිය වසරේ අභියෝග සහ ජයග්‍රහණ දෙස නැවත හැරී බලන විට කෝවිඩ් 19 වසංගතයෙන් පසුව විශේෂයෙන්ම ගෝලීය වශයෙන් ප්‍රකෘතිමත් වීමත් සිදුවෙමින් පවතින අතරතුරේ දී නිරන්තරයෙන්ම විකාශනය වන අධ්‍යාපන වපසරිය සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය මනා මඟපෙන්වීමක් සිදු කර ඇති බව පැහැදිලි ය. විවිධ හේතූන් නිසා ඇති වූ අඛණ්ඩ අභියෝග හමුවේ දී මානව සම්පත් අභිවර්ධන ආයතනය එම අභියෝග වලට ඔරොත්තු දීමට සහ ඒවාට අනුවර්තනය වීමට තමන් සතු හැකියාව නැවත වරක් 2022 වසරේදී ද පෙන්නුම් කර ඇත. "ශ්‍රී ලංකාවේ සේවක උසස් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම" යන එහි නිල කාර්යය සඳහා වන ඔවුන්ගේ කැපවීම නොසැලි පැවතිණි. මානව සම්පත් අභිවර්ධන ආයතනය , සිය විවිධ වූ ශිෂ්‍ය ප්‍රජාවගේ අද්විතීය අවශ්‍යතා සහ අභිලාෂයන් වලට ආමාන්ත්‍රණය කරමින් සේවකයින් සඳහා රට තුළ පවතින විශ්වවිද්‍යාල මට්ටමේ එකම උසස් අධ්‍යාපන ආයතන ලෙස ප්‍රමුඛ කාර්යයභාරයක් අඛණ්ඩව ඉටු කළේ ය.

වසර පුරාම, මානව සම්පත් අභිවර්ධන ආයතනය සිය ශිෂයන්ගේ පූර්ණ සංවර්ධනය සහ අධ්‍යයනය විශිෂ්ටත්වය සඳහා මැනවින් කැපවී සිටී. 2022 වසර තුලදී සහතික පත්‍ර, ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා, උපාධි, ශාස්ත්‍රපති යන ආදී උපාධි දරන උපාධිධාරීන් සැලකිය යුතු පිරිසක් අඛණ්ඩව ආයතනය විසින් බිහිකර ඇති බව මම ඉමහත් සතුටින් සඳහන් කරන්නෙමි. විවිධාකාර වූ අධ්‍යයන වැඩසටහන් හරහා ආයතනයේ සිසුන්ගේ දැනුම, කුසලතාව සහ ආකල්ප ඉහළ නැංවීම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය කැප වී ඇත. ඉගැන්වීම, ඉගෙනීම සහ පරියේෂණය යන අංග උසස් අධ්‍යාපනයේ අත්‍යවශ්‍යම අංග වේ. අධ්‍යාපනික නිදහස තහවුරු කරමින් මෙම ප්‍රධාන අංග තුන මත පදනම්ව තම කාර්යයභාරය සමතුලිතව කිරීමට අධ්‍යයනය කාර්යය මණ්ඩලය දක්වන කැපවීම අධ්‍යාපන සඳහා මනා පරිපූර්ණත්වයක් සහ නව්‍ය ප්‍රවේශයක් සඳහා වන සංවිධානයේ කැපවීම මැනවින් පිළිඹිබු කර ඇත.

ගෝලීය සන්දර්භය තුල ප්‍රගතිශීලි සමාජ සංවර්ධනය උදෙසා මානව සම්පත ශක්තිමක් කිරීමට, ඉගැන්වීම, ඉගෙනීම සහ පර්යේෂණය සඳහා වන විශිෂ්ටතම මධ්‍යස්ථානය වීම යන මානව සම්පත් අභිවර්ධන ආයතනයේ දැක්ම පැහැදිලිවම මෙන්ම ශක්තිමත්ව ද ක්‍රියාත්මක වේ. ඉගෙනීම, පර්යේෂණය සහ සංවර්ධනය පිළිබඳව ජාතික වශයෙන් තරඟකාරීව මෙන්ම ද අන්තර්ජාතිකව ද පිළිගත් අවස්ථාවන් ආයතනය අඛණ්ඩව සලසා දේ. නායකත්වය, ව්‍යවසායකත්වය සහ විචාරාත්මක චින්තනයේ නිපුණතාවය වර්ධනය මෙන්ම ඉහළ සමාජ සහ සාදාචාරාත්මක ප්‍රමිතීන් කේන්ද්‍ර ගත කරගෙන ද සෑම අතින්ම පරිපූර්ණත්වයට පුද්ගලයෙකු බිහිකිරීම මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කැපවීම විදහා දක්වන හොඳම සාක්ෂිය වේ. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ සිසුන් හට විවිධ හා අද්විතීය ඉගෙනුම් අවස්ථා සහ අත්දැකීම් ලබා දීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම ආයතනයේ අධ්‍යාපනික දර්ශනයේ පදනම වේ. හඳුනාගත් ප්‍රධානම ලක්ෂණය වන ස්වයං දැනුම වර්ධනය කිරීම නිසා මානව සම්පත් අභිවර්ධන ආයතනයෙන් බිහිවන උපාධිධාරීන් ඉතා ඵලදායී සේවකයින් වීම පමණක්ම නොව ඔවුන් තෝරාගත් වෘත්තීය, රැකියාව සහ ප්‍රජාව තුලද සාර්ථකත්වය සඳහා මැනවින් සන්නද්ධ වීමද

සහතික කරයි. අපේක්ෂික ඉල්ලකය වන්නේ ක්‍රියාකාරි , චිත්තවේගී සහ තත්වික හැකියාවන් වලින් පිරිපුන් අනාගත ඉල්ලක සඳහා ගෝලීය වශයෙන් සේවකයින් නිර්මාණය කිරීම ය.

මානව සම්පත් අභිවර්ධන ආයතනයෙහි මෙහෙවර සහ දැක්ම සඳහා වන අඛණ්ඩ කැපවීම මැනවින් පිළිඹිබු කරයි.ගෝලීය තත්වයන් විසින් එල්ල කරන ලද අභියෝග වල මුහුණ ආයතනයේ මුහුණ දීමේ හැකියාව පමණක් නොව ආයතනයට එවැනි අභියෝගවලට ඔරොත්තු දීමේ හැකියාව සහ ශක්තිමත්භාවය ද ඉස්මතු කොට ඇත.

පරිවර්තනීය අධ්‍යාපනික අත්දැකීම් ලබා දීම සහ යහපත් සමාජයක් ගොඩනැඟීමට දායක වීම සඳහා වන මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කාර්යය භාරය මෙම වාර්තාවෙන් ඉස්මතු කර ඇති ජයග්‍රහණ වලින් මනාව පැහැදිලි වේ. ඉදිරි වසර වලදී ද මානව සම්පත් අභිවර්ධන ආයතනයෙහි අඛණ්ඩ සාර්ථකත්වය සහ වර්ධනය දැකීමට මම බලාපොරොත්තු වෙමි.

මහාචාර්ය සාගර චන්ද්‍රසේකර
අධ්‍යක්ෂ
මානව සම්පත් අභිවර්ධන ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

පටුන

1. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ඉතිහාසය

1.1 මානව සම්පත් අභිවර්ධන ආයතනය ගැන කෙටියෙන්

1.2 2022 වර්ෂය තුළ මා.ස.අ. ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන පාඨමාලා

1.3 මා.ස.අ. ආයතනයේ කළමනාකාරීත්වය

1.4 මා.ස.අ. ආයතනයේ පරිපාලනමය සංවිධාන ව්‍යුහය (2022)

1.5 මා.ස.අ. ආයතනයේ කමිටු

1.5.1 කළමනාකරණ මණ්ඩලය සාමාජිකයන් (2021 මැයි මස සිට) - රැස්වීම් වාර 07ක් පවත්වා ඇත.

1.5.2 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අධ්‍යයන මණ්ඩල මගින් පවත්වන ලද රැස්වීම්

2. 2022 වර්ෂය තුළ ලබා ගත් සංවර්ධනය සහ ජයග්‍රහණ

2.1 සංවර්ධනයන්

2.2 ජයග්‍රහණයන්

2.2.1 අධ්‍යාපනික ජයග්‍රහණයන්

2.2.2 වසර තුළ පවත්වන ලද වැඩමුළු සහ ජාලගත සම්මන්ත්‍රණ

2.2.3 මානව සම්පත් අභිවර්ධන ආයතනික සමාජ වගකීම්

3. 2022 වර්ෂයේ සමාලෝචනය

3.1 අධ්‍යයන වැඩසටහන්

3.1.1 පශ්චාත් උපාධි වැඩසටහන්

3.1.2 ප්‍රථම උපාධි වැඩසටහන

3.1.2.1 ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය/ ශ්‍රම කළමනාකරණවේදී උපාධිය

3.1.3 විධායක/උසස් ඩිප්ලෝමා වැඩසටහන්

3.1.4 ඩිප්ලෝමා පාඨමාලා

3.1.5 සහතිකපත්‍ර පාඨමාලා

3.2 2022 වර්ෂයේ පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු

3.3 පර්යේෂණ, නවෝත්පාදනයන්, සහ ප්‍රකාශන පිළිබඳ තොරතුරු

3.4 අධ්‍යයන කාර්ය මණ්ඩලය, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු

3.5 පුස්තකාලය

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2022

1. ආයතනික තොරතුරු
2. පිළියෙල කිරීමේ පදනම
3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හි සාරාංශය
4. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය
5. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
6. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය
7. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය
8. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම/ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය
9. මුදල් ප්‍රකාශ සඳහා සටහන
10. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ෂෂෂ වන කොටසේ අංක 17 (ඇ) යටතේ දක්වා ඇති තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව - 2022
11. විගණන වාර්තා

1. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ඉතිහාසය

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ඉතිහාසය දශක හතරකට වඩා උරුමකම් කියන අතර එහි පූර්වක ආයතනය වූ සේවක අධ්‍යාපන ආයතනය 1979 අංක 11 දරන නියමාවලිය යටතේ 1975 වර්ෂයේ දී ස්ථාපනය කරන ලදී. 2006 වර්ෂයේ දී සේවක අධ්‍යාපන ආයතනය, මානව සම්පත් අභිවර්ධන ආයතනය ලෙස නම් කරන ලද අතර එය 2006 අංක 01 දරන නියමාවලිය මගින් සංශෝධනය කරනු ලැබිණ. 2017 අගෝස්තු 22 දිනැති අංක 2033/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධිත නියමාවලිය මගින් මානව සම්පත් අභිවර්ධන ආයතනයට උපාධි, ඩිප්ලෝමා, සහතිකපත් සහ අනෙකුත් අධ්‍යයන විශිෂ්ඨතා සහතික පිරිනැමීමට අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලදී. 2021 මාර්තු 16 දිනැති අංක 2219/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් නැවත නියමාවලිය සංශෝධනය කරනු ලැබූ අතර එම නියමාවලිය 2021 අංක 01 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලිය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. මානව සම්පත් අභිවර්ධන ආයතනය කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතනයකි.

දශක හතරකට අධික ඉතිහාසය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය එහි පරිස්ථිතිය තුළ වෙනස්කම් සහ නව සංවර්ධනයන් රැසක් අත්දැක ඇති අතර පෞද්ගලික අංශයේ වර්ධනය, දැනුම් ආර්ථිකයේ නිර්ගමනය හා ශ්‍රම බලකායේ ගෝලීයකරණය මේ අතරින් සැලකිය යුතු කීපයකි. මෙම සංවර්ධනයන් වැළඳ ගැනීමට දරන ප්‍රයත්නයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය අඛණ්ඩව පරිණාමය වී ඇති අතර එහිදී එහි මුල් අභිමතාර්ථයක් වන සේවා කණ්ඩායම් සඳහා අධ්‍යාපනය ලබා දීමේ නව අර්ථයක් ගෙන ඇත. වර්තමානයේදී සේවා කණ්ඩායම් ලෙස කළමනාකරණ/ වෘත්තීමය සේවා කණ්ඩායම් අර්ථ ගන්වන අතර මානව සම්පත් අභිවර්ධන ආයතනය මෙම කළමනාකරණ/ වෘත්තීමය සේවා කණ්ඩායම් හි මානව කුසලතා සංවර්ධනය සඳහා කැප වී සිටියි.

කොළඹ විශ්වවිද්‍යාලයීය ආයතනයක් වීම තුළ ආයතනයේ අධ්‍යයන කටයුතු කොළඹ විශ්වවිද්‍යාලයේ දැඩි අධීක්ෂණයට ලක් වේ. ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයක් පවත්වා ගත යුතු අධ්‍යයන කටයුතුවල උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ යහපත් සම්ප්‍රදායන් ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය බැඳී සිටී.

මානව සම්පත් අභිවර්ධන ආයතනය මූලිකවම ආරම්භ කරන ලද්දේ සියලුම කාණ්ඩවල සේවකයන්ට ඔවුන්ගේ කුසලතා නායකත්ව ගුණාංග සහ ශ්‍රමිකයන් ලෙස ඔවුන්ගේ වගකීම් පිළිබඳ පිළිගන්නා ගුණාත්මකභාවයෙන් යුත් පෘථුල උසස් මට්ටමේ අධ්‍යාපනයක් ලබා දීම සඳහා පහසුකම් සැලසීමටය. එමගින් ඔවුන්ට තම සේවා ස්ථානයන්හි ඵලදායී දායකත්වයක් ලබා දීමට හැකිවන අතර 1983 වන තෙක්ම එම උපාධිය ප්‍රදානය කරන ලද්දේ ශ්‍රාස්ත්‍රවේදී උපාධියක් වශයෙනි. කෙසේ වුවද 1986 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය පිරිනැමීම ආරම්භ කරන ලද අතර 2007 වර්ෂයේ දී මානව සම්පත් අභිවර්ධන ආයතනය සිය අධ්‍යයන ක්‍රියාකාරකම් ව්‍යාප්ත කරමින් ශාස්ත්‍රපති උපාධි පිරිනැමීම ද ආරම්භ කරන ලදී.


1.1 මානව සම්පත් අභිවර්ධන ආයතනය ගැන කෙටියෙන්

2022 වර්ෂයේ දී මානව සම්පත් අභිවර්ධන ආයතනය ශාස්ත්‍රපති උපාධි විද්‍යාර්ථීන් 412 ක් සහ ප්‍රථම උපාධිය හදාරන විද්‍යාර්ථීන් 523 ක් ඇතුළුව සිසු සිසුවියන් 3,400 කට ආසන්න සංඛ්‍යාවකට අධ්‍යාපනය ලබා දී ඇත. මානව සම්පත් අභිවර්ධන ආයතනය, එය පිහිටුවා ඇති අරමුණ සැලකිල්ලට ගෙන ගතික අධ්‍යයන වැඩසටහන් පිරිනමනු ලබයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් අනුමැතිය ලබා ගන්නා ලද නව උපාධි වැඩසටහන වන ශ්‍රම කළමනාකරණවේදී උපාධිය (සාමාන්‍ය) තුන් අවුරුදු පාඨමාලාවට ප්‍රථම විද්‍යාර්ථීන් කණ්ඩායම ඇතුළත් කර ගැනීමට වර්ෂය තුළ දී කටයුතු කරන ලදී.

නව උපාධි පාඨමාලාව උසස් ගුණාත්මකභාවයෙන් යුත් රැකියා නියුක්ත උපාධි අපේක්ෂකයින්ට සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය දෙකෙන්ම පාඨමාලාව හැදෑරීමට අවස්ථාව සලසා දී ඇත. අපගේ ප්‍රථම උපාධි වැඩසටහන ප්‍රධාන වශයෙන්ම වැඩකරන ප්‍රජාවට ඔවුන්ගේ වැඩ පරිසරයට ගැළපෙන පරිදි සිය කුසලතා, හැකියාවන් සහ නායකත්ව කුසලතා දියුණු කර ගැනීම ඉලක්ක කොට ඇත.

මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පිරිනමනු ප්‍රධාන කාණ්ඩ 04ක් යටතේ අධ්‍යයන වැඩසටහන් පවත්වාගෙන යනු ලැබේ. ඒවා නම් පශ්චාත් උපාධි පාඨමාලා 04ක්, උපාධි පාඨමාලා 02ක්, උසස්/විධායක ඩිප්ලෝමා පාඨමාලා 03ක්, ඩිප්ලෝමා පාඨමාලා 05ක් සහ සහතිකපත්‍ර පාඨමාලා 10 ක් වශයෙනි. මෙම පාඨමාලා 2018-2022 ආයතනික සැලැස්මට අනුකූලව පෙළගස්වා ඇත.

සමස්ථ ශිෂ්‍ය ලියාපදිංචිය - 2022



මූලාශ්‍රය - රැස් කළ දත්ත 2022 මා.ස.අ.ආ.

2022 වර්ෂය තුළ ඉහත දක්වා ඇති පරිදි සමස්ත සිසු සිසුවියන් 3,395 ක් විවිධ අධ්‍යයන පාඨමාලා හදාරන ලදී.

1.2 2022 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන පාඨමාලා

පශ්චාත් උපාධි පාඨමාලා

- සේවා කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලාව
- ව්‍යාපාර කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව
- මානව සම්පත් කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව
- ආපදා විශ්ලේෂණ, කළමනාකරණ සහ පාලනය විද්‍යාපති පාඨමාලාව

ප්‍රථම උපාධි පාඨමාලා

- ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව
- ශ්‍රම කළමනාකරණවේදී උපාධි පාඨමාලාව

විධායක/උසස් ඩිප්ලෝමා සහ ඩිප්ලෝමා පාඨමාලා

- සංචාරක, සිදුවීම් සහ ආගන්තුක සත්කාර සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමා පාඨමාලාව
- උපදේශනය සහ මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමා පාඨමාලාව
- සේවා කළමණාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව
- සේවා කළමණාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
- මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණය ඩිප්ලෝමා පාඨමාලාව
- උපදේශනය සහ මනෝවිද්‍යාව ඩිප්ලෝමා පාඨමාලාව
- අතිරේක භාෂාවක් ලෙස දමිළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව
- ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව

සහතිකපත් පාඨමාලා

- ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව
- පාසල් හැරයන්නන් සඳහා වූ කෙටිකාලීන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව
- ඉංග්‍රීසි භාෂා පදනම් සහතිකපත් පාඨමාලාව
- දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - මූලික මට්ටම
- දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම මට්ටම
- පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව
- ජපන් භාෂා සහතිකපත් පාඨමාලාව - මූලික මට්ටම
- ජපන් භාෂා සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම මට්ටම
- කොරියානු භාෂා සහතිකපත් පාඨමාලාව - මූලික මට්ටම
- කොරියානු භාෂා සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම මට්ටම


අභියෝගාත්මක ගෝලීය තත්වයන් හමුවේ මුහුණ දීමට මෙන්ම අපගේ ජාතික සංවර්ධනයේ මානව පදනම ශක්තිමත් පරිණත, බුද්ධිමත් දැනුම භාවිත කරන්නන් ලෙස මානව සම්පත අභිවර්ධනය කිරීමට සම්පූර්ණයෙන් කැප වූ විශිෂ්ට ආයතනයක් බවට පත් වීමට මානව සම්පත් අභිවර්ධන ආයතනය බලාපොරොත්තු වේ. මෙම අරමුණ මුදුන් පමුණුවා ගැනීම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලයෙන් උරුම වී ඇති ධනාත්මක ශාස්ත්‍රීය

සම්ප්‍රදායන් සහ උසස් අධ්‍යයන ප්‍රමිතීන් තහවුරු කර ගනිමින් විශාල පරිවර්තනයකට බඳුන් වෙමින් පවතී. යහ පාලනයේ ප්‍රමිතීන් සපුරාලීම, ආයතන අධ්‍යයන වැඩසටහන් සඳහා දේශීය හා ගෝලීය ප්‍රතිනයන් ලබා ගැනීම සහ එමගින් සමාජීය වගකීමකින් යුත් ඉහළම ඉල්ලුමක් ඇති සේවක සන්නාමයක් සහිත රාජ්‍ය ආයතනයක් බවට පත් වීම මෙම පරිවර්තනයේ අරමුණ වේ.

1.3 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කළමනාකාරිත්වය

2021 මාර්තු මස සිට ක්‍රියාත්මක වන 2021 අංක 01 දරන නියමාවලිය මගින් ආයතන පරිපාලන ව්‍යුහයේ වෙනස් කිරීමක් සිදු වූ අතර, නව නියමාවලියට අනුව ආයතනයේ ප්‍රධාන පරිපාලන ව්‍යුහය කළමනාකරණ මණ්ඩලයකින් සහ අධ්‍යයන සමායෝජක කමිටුව, අධ්‍යයන මණ්ඩල සහ කමිටු මගින් ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂවරයා, ආයතනයේ පරිපාලනමය සහ අධ්‍යයන ප්‍රධානියා වශයෙන් සේවයේ නියුක්ත වන පූර්ණ කාලීන නිලධාරියෙකු වේ. නව නියමාවලියට අනුව ආයතන අධ්‍යක්ෂකවරයා පත් කිරීමේ බලය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පැවරී තිබේ. එහිදී අධ්‍යක්ෂකවරයා, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය මත කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ එකඟතාව සහිතව උප කුලපතිවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත නිර්දේශ කරනු ලබන අතර, අධ්‍යක්ෂකවරයා තෝරා පත් කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි. අධ්‍යක්ෂකවරයා කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා වන අතර අධ්‍යයන කමිටු සඳහා නිලබලයෙන් පත් වූ සාමාජිකයෙකුද වේ. ඔහු ආයතනයේ ප්‍රධාන ගිණුම් නිලධාරියා ද වන අතර ආයතනය තුළ විනය පවත්වාගෙන යාමේ වගකීම දරන්නා ද වේ. ආයතනයේ සංවිධාන ව්‍යුහය පහත දක්වා ඇත.

1.4 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පරිපාලනමය සංවිධාන ව්‍යුහය (2022)



මෙම නව ව්‍යුහය ආයතනයේ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්මට අනුකූලවන පරිදි සකස් කොට ඇත.

1.5 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කමිටු

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පරිපාලනමය සංවිධාන ව්‍යුහයට අනුව එහි අධ්‍යයන මණ්ඩල හතර (04) ශාස්ත්‍රීය කමිටුවේ අනුමැතිය සහිතව පිහිටුවා ඇත. නව නියමාවලි සංශෝධනයෙන් පසු 2021 මැයි මස සිට කළමනාකරණ මණ්ඩලය ලෙස ප්‍රධාන පරිපාලන ව්‍යුහය වෙනස් කෙරුණු අතර අධ්‍යයන විෂය ක්ෂේත්‍ර අනුව පිහිටවූ අධ්‍යයන මණ්ඩල අධ්‍යයන සමායෝජක කමිටුවට යටත් වේ. තවද අධ්‍යක්ෂවරයාගේ මාර්ගෝපදේශනය යටතේ පිහිටුවා ඇති කමිටු හතකින් (07) ද පරිපාලන ව්‍යුහය සමන්විත වේ.

1.5.2 කළමනාකරණ මණ්ඩලය සාමාජිකයන් - රැස්වීම් වාර 15 ක් පවත්වා ඇත.

නම	පත් කරන ලද අධිකාරිය
ජ්‍යේෂ්ඨ මහාචාර්ය එච්.ඩී. කරුණාරත්න මහතා	සභාපති
මහාචාර්ය උපුල් සොන්නාදර මහතා	නිල බලයෙන් පත් වූ සාමාජික
මහාචාර්ය ලසන්ත මානවඩු මහතා	නිල බලයෙන් පත් වූ සාමාජික
ආචාර්ය කපිල බණ්ඩාර මහතා	නිල බලයෙන් පත් වූ සාමාජික
මහාචාර්ය ඩී.එම්.ඒ. දිසානායක මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ආචාර්ය එම්.ඒ.සී. ගයත්‍රි විජේසුන්දර	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
එච්.එම්.ඩබ්. හේරත් මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ප්‍රේමචන්ද්‍ර ඇපා මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
දමිත වික්‍රමසිංහ මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ආර්.ඒ.යූ රණවීර මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ජේ.ඒ.ටී.ඩී. සරත් කුමාර මහත්මිය (2021 අගෝස්තු මස සිට)	මහා භාණ්ඩාගාර නියෝජිත
වී. ප්‍රභාෂිලන් මහතා (2022 මාර්තු මස 21 සිට)	මහා භාණ්ඩාගාර නියෝජිත
මහාචාර්ය එම්.පී.පී. ධර්මදාස	අධ්‍යයන මණ්ඩල නියෝජිත
මහාචාර්ය ඩබ්.එස්. චන්ද්‍රසේකර මහතා	අධ්‍යයන මණ්ඩල නියෝජිත
එච්.ඩී. ධර්මසේකර මහතා	අධ්‍යයන මණ්ඩල නියෝජිත

2021 අංක 01 නව නියමාවලියට අනුව ආයතනයේ පැවති අධ්‍යයන මණ්ඩල හතර (04) සහ කමිටු හත (07) ට අමතරව අධ්‍යයන සම්බන්ධීකරණ කමිටුව නමින් නව කමිටුවක් පත් කරන ලද අතර අධ්‍යයන මණ්ඩල හතරෙහි (04)හි නිර්දේශයන් කළමනාකරණ මණ්ඩලය වෙත යොමු කිරීම මෙම කමිටුව හරහා සිදු කෙරේ.

1.5.3 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අධ්‍යයන මණ්ඩල මගින් පවත්වන ලද රැස්වීම්

අධ්‍යයන මණ්ඩලය	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව
පශ්චාත් උපාධි අධ්‍යයන හා පර්යේෂණ මණ්ඩලය	10
ප්‍රථම උපාධි පාඨමාලා අධ්‍යයන මණ්ඩලය	13
භාෂා ඉගෙනුම් වැඩසටහන් අධ්‍යයන මණ්ඩලය	10
ව්‍යාප්ති වැඩසටහන් අධ්‍යයන මණ්ඩලය	12

1.5.4 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කමිටු මගින් පවත්වන ලද රැස්වීම්

ශාස්ත්‍රීය කමිටුව/කළමනාකරණ මණ්ඩලයට සෘජුව වග කියනු ලබන කමිටු හත (07)කින් ආයතනික ව්‍යුහය සමන්විත වේ. එම කමිටුවල විස්තර පහත දක්වා ඇත.

කමිටුව	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව
අධ්‍යයන සම්බන්ධීකරණ කමිටුව	10
විගණන කමිටුව (ස්වාධීන කමිටුවකි.)	04
මූල්‍ය කමිටුව	11
පුස්තකාල කමිටුව	03
ප්‍රසම්පාදන කමිටුව	-
පර්යේෂණ ප්‍රතිපාදන සහ පුහුණු කමිටුව	03
අභ්‍යන්තර තත්ත්ව කමිටුව	-

2. 2022 වර්ෂය තුළ සංවර්ධනය සහ ලබා ගත් ජයග්‍රහණ

2.1 සංවර්ධනයන්

- 2021 මාරක්ඩතු 16 දිනැති අංක 2219/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් නියමාවලිය සංශෝධනය වීම. 2021 මාර්තු මස සිට ක්‍රියාත්මක වන 2021 අංක 01 දරන නියමාවලිය මගින් ආයතන පරිපාලන ව්‍යුහයේ වෙනස් කිරීමක් සිදු වූ අතර, නව නියමාවලියට අනුව ආයතනයේ ප්‍රධාන පරිපාලන ව්‍යුහය කළමනාකරණ මණ්ඩලයකින් සහ අධ්‍යයන සම්බන්ධීකරණ කමිටුව, අධ්‍යයන මණ්ඩල සහ කමිටු මගින් ක්‍රියාත්මක වේ.

- නව උපාධි පාඨමාලාව ශ්‍රම කළමනාකරණවේදී (සාමාන්‍ය) සහ ශ්‍රම කළමනාකරණවේදී (ගෞරව) උපාධි ලෙස ගෞරව උපාධි පාඨමාලාවක් දක්වා උසස් කිරීමට හැකි විය. ඒ අනුව, විද්‍යාර්ථීන් සඳහා පුළුල් අවස්ථා විවෘත කරමින් විෂයමාලා සංවර්ධනය කොට නව්‍ය මුහුණුවරකින් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

2.2 ජයග්‍රහණයන්

2.2.1 අධ්‍යාපනික ජයග්‍රහණයන්

- උසස් අධ්‍යාපනයට නව මංපෙත් විවර කරමින් පශ්චාද් උපාධි ඩිප්ලෝමා පැවැත්වීමට අවශ්‍ය නීති-රෙගුලාසිමාලාව සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීමට හැකි විය.
- ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන, සියලුම පශ්චාද් උපාධි වැඩසටහන්, විධායක/ උසස් ඩිප්ලෝමා හා ඩිප්ලෝමා වැඩසටහන් මෙන්ම සහතිකපත් පාඨමාලාවන් යන සෑම වැඩසටහනකම අත්නර්ක්‍රියාකාරී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමයක් සාර්ථකව උපයෝජනය කෙරේ.
- අධ්‍යයන කටයුතු සඳහා සහතිකපත් වැඩසටහන් හැර අනෙක් සියලුම අධ්‍යයන වැඩසටහන් ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) සාර්ථකව භාවිතා කරයි.

- ඩිප්ලෝමා වැඩසටහන් සඳහා ද මිශ්‍ර ඉගෙනුම්-ඉගැන්වීම් (BTL) ක්‍රමවේදය සාර්ථකව සිදුවෙමින් පවතී.
- විධායක/ උසස් ඩිප්ලෝමා හා ඩිප්ලෝමා වැඩසටහන් සඳහා විෂයමාලා සමාලෝචනය කිරීමේ කටයුතු සාර්ථකව සිදුවෙමින් පවතී.
- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන වැඩසටහන්වල නව පියවරක් තබමින් ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාවක් හඳුන්වා දීම සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී.
- අධ්‍යයන කාර්ය මණ්ඩල එක් සාමාජිකයෙක් විදේශගතව පශ්චාත් උපාධිය සඳහා අධ්‍යයනය කටයුතු කරමින් සිටී.
- පුස්තකාල සුචිය සංවර්ධනය කිරීම සහ ඩිජිටල් ගබඩාව (IHRA/LDR) සම්පූර්ණ කොට ඇත.

2.2.1.2 වසර තුළ පවත්වන ලද වැඩමුළු සහ ජාලගත සම්මන්ත්‍රණ

- ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව 2019/2020 ශිෂ්‍ය කණ්ඩායම් සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ මාර්ගගත වැඩමුළු සාර්ථකව පවත්වන ලදී.
- සේවා කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලාවන්හි කණ්ඩායම් අංක 05 සහ 07 බාහිර පුහුණු වැඩසටහන් බෙලිහුල්ඔය "*Academy of Adventure*" හිදී 2022 මාර්තු මස 5/6 දෙදින සාර්ථකව පවත්වන ලදී.
- උපදේශන මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමා පාඨමාලාව සහ උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමා පාඨමාලාව යන පාඨමාලාවන්හි 2022 අධ්‍යයන වර්ෂයේ අංක 04 සහ 05 ශිෂ්‍ය කණ්ඩායම් සඳහා ක්ෂෙත්‍ර චාරිකා වැඩමුළු කිහිපයක් සාර්ථකව පවත්වන ලදී.
- මානව සම්පත් කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව සහ ව්‍යාපාර කළමනාකරණාධිපති උපාධි පාඨමාලාවන්හි 2020/2022 වසර විද්‍යාර්ථීන් සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ වැඩමුළු සහ කළමනාකරණ මූලධර්ම සහ භාවිතය පිළිබඳ වැඩමුළු සිගිරිය අරලිය හෝටලයේ සහ "*Club palm bay"* හෝටලයේ දී සාර්ථකව පවත්වන ලදී.

2.2.1.3 මානව සම්පත් අභිවර්ධන ආයතනික සහභාගිත්ව සමාජ වගකීම්

- කොළඹ විශ්වවිද්‍යාලයිය මානව සම්පත් අභිවර්ධන ආයතනයේ සේවක සුභසාධක සංගමය එක්ව සංවිධානය කරන ලද පොත් හා අත්‍යවශ්‍ය පාසල් ලිපිද්‍රව්‍ය බෙදා දීමේ වැඩසටහනක් අ/විලච්චිය සාලිය මාලා විද්‍යාලය සහ අ/සියඹලාගස්වැව අශෝක විද්‍යාලයේ සිසුන් සඳහා සාර්ථකව ක්‍රියාවට නැංවිණි. 332 ක් වූ එම පාසල් දෙකෙහිම සමස්ත ශිෂ්‍ය ප්‍රජාවට මෙම වැඩසටහන මඟින් පහසුකම් සැපයිණි.

3.1 අධ්‍යයන වැඩසටහන්

2022 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය කාණ්ඩ පහක් යටතේ අධ්‍යයන වැඩසටහන් 24 ක් පවත්වන ලදි.

- පශ්චාද් උපාධි වැඩසටහන්
- ප්‍රථම උපාධි වැඩසටහන
- විධායක ඩිප්ලෝමා වැඩසටහන්
- ඩිප්ලෝමා වැඩසටහන්
- සහතිකපත්‍ර වැඩසටහන්

3.1.1. පශ්චාද් උපාධි වැඩසටහන්

මානව සම්පත් අභිවර්ධන ආයතනය පශ්චාද් උපාධි හතරක් (04) ඉදිරිපත් කරයි. මානව සම්පත් අභිවර්ධන ආයතයේ පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා විද්‍යාර්ථීන් මූලිකවම ස්වකීය වෘත්තිය සංවර්ධනය වේගවත් කර ගැනීම, තෝරාගත් අංශයන්හි දැනුම ප්‍රගුණ කර ගැනීම, තම වෘත්තිය මාවත්වල ප්‍රගතියක් ලබා ගැනීම, රැකියා අවශ්‍යතා පූර්ණය කර ගැනීම මෙන්ම ඉපැයීමේ ශක්‍යතාව ඉහළ නංවා ගැනීම වැනි ඉලක්කයන් මුදුන් පමුණුවා ගැනීම අරමුණු කොට ගෙන අප ආයතනය හා එක්වේ.

මානව සම්පත් අභිවර්ධන ආයතනය අඛණ්ඩ ඇගයීම්, වැඩමුළු සහ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සහ ජාලගත සම්මන්ත්‍රණ ඇතුළත් වූ ආවේණික වූ ඉගැන්වීම් ශෛලිය විද්‍යාර්ථීන්ගේ අඛණ්ඩ වර්ධනය වේගවත් කරයි. මානව සම්පත් අභිවර්ධන ආයතනය සෑම විටම පාඨමාලා විෂය මාලා වැඩිදුර සංවර්ධනය සහ ශිෂ්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා විද්‍යාර්ථීන්ගෙන් ලබා ගන්නා ප්‍රතිපෝෂණ කෙරෙහි අවධානය යොමු කරයි. තරඟකාරී වෙළඳපොළ අවශ්‍යතා වෙනුවෙන් සැලසුම් කොට ඇති මෙම පශ්චාද් උපාධි පාඨමාලාවන්ගෙන් බිහිවන පශ්චාද් උපාධිලාභින් රටේ ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දේ.


වර්තමානයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය විද්‍යාර්ථීන් සඳහා කළමනාකරණ විෂය ක්ෂේත්‍රයට අදාළව පශ්චාද් උපාධි අධ්‍යයන පාඨමාලා හතරක් (04) පවත්වාගෙන යනු ලබන අතර ඒවා නම්,

- ව්‍යාපාර කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව
- මානව සම්පත් කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව
- සේවා කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලාව
- ආපදා විශ්ලේෂණ කළමනාකරණ සහ පාලනය විද්‍යාපති පාඨමාලාව

වශයෙනි.

ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයේ අවශ්‍යතා මානනය කෙරෙහි ව්‍යාපාර කළමනාකරණාධිපති පාඨමාලාව අවධානය යොමු කොට ඇති අතර මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍ර වර්තමාන අවශ්‍යතා කෙරෙහි මානව සම්පත් කළමනාකරණාධිපති පාඨමාලාව අවධානය යොමු කොට ඇත. සේවා කළමනාකරණ විද්‍යාපති උපාධිය අපගේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඇති විශේෂිත පශ්චාද් උපාධි පාඨමාලාවක් වන්නේ එය සේවා කළමනාකරණ වෙනුවෙන් පවත්වනු ලබන එකම පශ්චාද් උපාධි පාඨමාලාව වීමයි. එය සේවා අංශයේ සේවා සම්බන්ධ ඕනෑම ගැටලුවකට මනා විශ්වාසයකින් මුහුණ දීම සඳහා අවශ්‍ය කරන්නා වූ සංකල්පීය සහ විශ්ලේෂණාත්මක මෙවලම් සම්පාදනය කෙරෙහි අවධානය යොමු කොට ඇත.

භූ තොරතුරු විද්‍යාපති පාඨමාලාව සඳහා 2017 වර්ෂයේ සිට විද්‍යාර්ථීන් ලියාපදිංචි කරගැනීමක් සිදු කර නොමැති අතර ලියාපදිංචි වූ විද්‍යාර්ථීන්ට පාඨමාලාව සම්පූර්ණ කිරීමට අනුමැතිය දී තිබුණි. 2021 වර්ෂයේ පශ්චාද් උපාධි අධ්‍යයන වැඩසටහන්වල උපාධි පූර්ණ අනුපාතය 46% ක් විය.[1]



	වාර්ෂික ඇතුළත් කරගැනීම					උපාධිලාභීන් සංඛ්‍යාව			
	2017	2018	2019	2020	2021	2017	2018	2019	2020
ව්‍යාපාර කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව	95	115	96	70	59	127	125	64	86
මානව සම්පත් කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව	54	67	65	53	74	135	96	44	59
සේවා කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලාව	0	77	0	40	83	54	62	73	0
භූ තොරතුරු විද්‍යාපති උපාධි පාඨමාලාව	0	0	0	0	0	54	5	55	5
ආපදා විශ්ලේෂණ, කළමනාකරණ සහ පාලනය විද්‍යාපති උපාධි පාඨමාලාව	0	48	0	0	22	38	11	3	0

මූලාශ්‍රය රැස් කළ දත්ත, 2021, මා.ස.අ.ආ.

[1] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ හෝ උපාධිලාභී සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බදවා ගැනීමට අදාළ නොවේ.

3.1.2 ප්‍රථම උපාධි වැඩසටහන


3.1.2.1 ශ්‍රම කළමනාකරණවේදී උපාධිය/ ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ප්‍රධාන අභිමතාර්ථ අතරින් එකක් වනුයේ අවශ්‍ය වන්නා වූ ප්‍රමාණාත්මක සහ ගුණාත්මකභාවයෙන් මානව කුසලතා වර්ධනය කර ගැනීම සහ ශ්‍රමික මෙන්ම කළමනාකරණරුවන් සාමූහික වරණයන් සහ සාමූහික ප්‍රයත්නයන් සඳහා අධ්‍යාපනය ලබා දීමත් ය. එයට අනුව ශ්‍රම අධ්‍යාපනවේදී වැඩසටහන ආරම්භ කරන ලදී. කෙසේවෙතත් වෙළඳපොළ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් සහ විද්‍යාර්ථීන්ට පුළුල් අවස්ථා උදා කරමින් 2020 වර්ෂයේදී, ශ්‍රම කළමනාකරණවේදී උපාධි වැඩසටහන හඳුන්වා දෙන ලදී.

2021 වර්ෂයේදී, අපේක්ෂකයින් 193ක් ශ්‍රම කළමනාකරණවේදී උපාධි වැඩසටහනට ලියාපදිංචි වූ අතර ඉන් 152ක් සිංහල මාධ්‍ය සඳහා ද 41ක් ඉංග්‍රීසි මාධ්‍ය සඳහා ද විය.

මානව සම්පත් අභිවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන ශ්‍රම කළමනාකරණවේදී උපාධිය (සාමාන්‍ය) සහ ශ්‍රම කළමනාකරණවේදී (ගෞරව) උපාධිය යන මෙම වැඩසටහන් දෙකම කළමනාකරණ ක්ෂේත්‍රයේ පුළුල් විෂය ක්ෂේත්‍රයක් ආවරණය කරන අතර ඒවා ප්‍රථම වරට සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන් ම පැවැත්වේ. ශ්‍රම කළමනාකරණවේදී උපාධිය තුන් අවුරුදු වැඩසටහනක් වන අතර එය ■ ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ 5 වෙනි ස්ථරයට අයත් වේ. ශ්‍රම කළමනාකරණවේදී (ගෞරව) උපාධිය සිව් අවුරුදු වැඩසටහනක් වන අතර එය ■ ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ 6 වෙනි ස්ථරයට අයත් වේ. අධ්‍යයන දිශානතියේ මෙම සැලකිය යුතු වෙනස්කම් සමග ■ ලංකාවේ අංක එක ලෙසින් ශ්‍රේණිගත කීර්තිමත් විශ්වවිද්‍යාලයක් වන කොළඹ විශ්වවිද්‍යාලයෙන් තම උසස් අධ්‍යාපන කටයුතුවල නියැලීමෙන් පළපුරුද්ද මෙන්ම දැනුම ලබා ගැනීමට ද වෘත්තිය ජීවිතයේ ඉදිරියට ගමන් කිරීමට ද රැකියා නියුක්තිකයන්ට අභ්‍යන්තර උපාධියක් ලෙසින් මෙම නව අධ්‍යයන වැඩසටහන ඉතා යෝග්‍ය වනු ඇත.

ශ්‍රම කළමනාකරණවේදී උපාධි වැඩසටහන සඳහා අයදුම්පත් කැඳවුව ද රට තුළ පැවති කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් 2020 වසරේදී විද්‍යාර්ථීන් බඳවා ගැනීම සිදු නොකරන ලදී. 2021 වර්ෂයේ ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවේ සමස්ථ උපාධි පූර්ණ අනුපාතය 69%ක් විය.[1]



මූලාශ්‍රය රැස් කළ දත්ත, 2021, මා.ස.අ.ආ.


[1] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ හෝ උපාධිලත් සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.

3.1.3. විධායක/උසස් ඩිප්ලෝමා වැඩසටහන්

මෙම වැඩසටහන්හි ප්‍රධාන පරමාර්ථය වන්නේ කළමනාකරුවන්ට වැඩ කිරීමේදී පවරා ඇති ක්ෂේත්‍රයන්හි ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීමට සහ යාවත්කාලීන කිරීමට අවස්ථා සැලසීමයි. සියලුම විධායක ඩිප්ලෝමා වැඩසටහන් පුද්ගලික සංවර්ධනය කේන්ද්‍ර කොට ඇත්තේ, පාඨමාලා හදාරන්නන්ට ඔවුන්ගේම හැසිරීම් චර්යා රටාවන්ට අභියෝග කරමින් පෞද්ගලික අත්දැකීමක් ලෙස ගෙන තම සේවාදායකයින් සමඟ ඵලදායී ලෙස කටයුතු කිරීමේ පදනමට එය ඉතා වැදගත් වේයැයි ස්ථිර විශ්වාසයේ මුල් බැසගෙනය.

මෙම පාඨමාලාවන්හි අධ්‍යයන කාලය එක් වසරකි. මානව සම්පත් අභිවර්ධන ආයතනය ඊටම ආවේණික වූ ඉගැන්වීම් ශෛලිය, අඛණ්ඩ ඇගයීම්, වැඩමුළු සහ ක්ෂේත්‍ර අධ්‍යයන හේතුවෙන් ශිෂ්‍යයින්ට ඔවුන් වෘත්තියභාවය සංවර්ධනය කර ගැනීමට වේදිකාව සම්පාදනය කරයි.

වසංගත තත්වය සහ නව පාඨමාලා විෂයමාලා සංවර්ධන කටයුතු හේතුවෙන් තාවකාලිකව නවත්වන ලද පාඨමාලාවන් ආරම්භ නොකිරීම හේතුවෙන් 2021 වර්ෂයේදී, ශිෂ්‍ය බඳවා ගැනීම් සිදු කෙරුණේ සංචාරක, සිදුවීම් සහ ආගන්තුක සත්කාර කළමනාකරණ විධායක ඩිප්ලෝමාව සහ උපදේශන මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමාව යන පාඨමාලා සඳහා පමණි.



	වාර්ෂික ඇතුළත් කර ගැනීම					සුදුසුකම්ලත් සංඛ්‍යාව				
	2017	2018	2019	2020	2021	2017	2018	2019	2020	2021
මානව සම්පත් කළමනාකරණය විධායක ඩිප්ලෝමාව	0	17	0	0	0	0	35	0	21	0
සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමාව	0	0	0	0	0	0	115	0	0	0
සංචාරක, සිදුවීම් සහ ආගන්තුක සත්කාර කළමනාකරණ විධායක ඩිප්ලෝමා පාඨමාලාව	0	0	30	22	21	0	0	0	19	19
උපදේශන මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමාව	0	49	0	80	63	0	0	0	25	0

මූලාශ්‍රය රැස් කළ දත්ත, 2021, මා.ස.අ.ආ.


3.1.4 ඩිප්ලෝමා පාඨමාලා

මානව සම්පත් අභිවර්ධන ආයතනය මගින් ඩිප්ලෝමා වැඩසටහන් 04ක් පිරිනමනු ලබන ලබයි. ඒවා කළමනාකරණ, මානව ශාස්ත්‍ර සහ භාෂා පාඨමාලාවලින් සමන්විත වේ. මෙම පාඨමාලා මූලික මට්ටමේ රැකියා නියුක්තිකයන්ට තමන්ගේ අදාළ ක්ෂේත්‍රය තුළ දැනුම, විශ්ලේෂණාත්මක චින්තනය, හැකියාවන් ගොඩනැගීම, සදාචාරාත්මක ප්‍රමිතීන්, නායකත්වය සහ වගකීම් දැරීම දියුණු කිරීම සඳහා සහාය වීමට සැලසුම් කර ඇත. සිසුන්ට ඔවුන්ගේ විවිධ අවශ්‍යතාවන් සපුරා ගැනීමට මෙම ඩිප්ලෝමා පාඨමාලා මහෝපකාරී වේ. ඇතැම් අවස්ථාවල දී ඒවා අධ්‍යාපන

කටයුතුවල විවිධ අවධීන් අතර ඇති පරතරය පුරවාලීම සඳහා හෝ අමතර වෘත්තීය පුහුණුවක් සහ සුදුසුකම් සැපයීම සඳහා උපකාරී වේ. තවද ඩිප්ලෝමා පාඨමාලාවක් මගින් වැදගත් විශේෂිත කුසලතා, දැනුම සහ අත්දැකීම් සම්පාදනය කරයි.

වෘත්තිය උපදේශකවරයෙකු වීම සඳහා තම කුසලතා වැඩි දියුණු කර ගැනීමට කවුරුන් හෝ අධ්‍යයන වැඩසටහනක් සොයන්නේ නම්, ඔහුගේ/ ඇයගේ අධ්‍යයන අරමුණ සාක්ශාත් කර ගැනීමට උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමාව විශිෂ්ඨ අවස්ථාවක් ලබා දේ. මෙම පාඨමාලාව වෘත්තිය උපදේශකවරයෙකුගේ කාර්යභාරය කෙරෙහි ඉලක්ක කොට ශක්තිමත් පදනමක් ලබා දීමට නිර්මාණය කර ඇත. මෙම වැඩසටහනේ ප්‍රායෝගික අංග සේවා පරිශීලකයා සමග ශක්තිමත් සම්බන්ධතාවක් ගොඩ නඟා ගැනීමට මෙන්ම ඔවුන්ගේ ජීවිතයේ යහපත් දියුණුවක් ඇති කර ගැනීමට මඟ පෙන්වීම සඳහා පුද්ගලයෙකුගේ මූලික උපදේශන කුසලතා ශක්තිමත් කරනු ඇත. උපදේශන මනෝවිද්‍යා විප්ලෝමාව හැදෑරීමෙන් ශිෂ්‍යයින් මූලික උපදේශන ක්‍රම සහ ප්‍රවේශයන් ඉගෙන ගනු ඇත.

නව විෂයමාලා සංවර්ධනයෙන් පසු සේවා කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා 2021 වසරේදී ශිෂ්‍ය බඳවා ගැනීම නැවත ආරම්භ කරන ලදී. තවද මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව සඳහාද ශිෂ්‍යයින් ලියාපදිංචි කර ගැනීමට මෙම වසරේදී හැකියාව ලැබුණි.




	වාර්ෂික ඇතුළත් කර ගැනීම					සුසුසුකම්ලත් සංඛ්‍යාව				
	2017	2018	2019	2020	2021	2017	2018	2019	2020	2021
සේවා කළමනාකරණ ඩිප්ලෝමාව	0	0	0	0	71	0	27	11	0	0
මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව	0	0	46	40	32	0	27	0	28	28
උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමාව	0	49	0	78	94	55	29	29	15	0
අතිරේක භාෂාවක් ලෙස දමිළ භාෂා ඩිප්ලෝමාව	96	90	92	0	0	100	74	73	0	68

මූලාශ්‍රය රැස් කළ දත්ත, 2021, මා.ස.අ.ආ.

3.1.5 සහතිකපත් පාඨමාලා

මානව සම්පත් අභිවර්ධන ආයතනය ශිෂ්‍යයින්ගේ වෘත්තිමය සංවර්ධනය ඉලක්ක කොට විවිධ විෂය ක්ෂේත්‍රයන්හි සහතිකපත් පාඨමාලා දහයක් (10) පිරිනමනු ලබයි. මෙම වැඩසටහන්වල විස්තර පහත ප්‍රස්ථාර හා වගු මගින් පෙන්වා ඇත. මෙම වැඩසටහන්වල පාඨමාලා කාල සීමාව මාස 03 සිට මාස 08 දක්වා වේ.

කොවිඩ් - 19 වසංගත තත්වය හමුවේ, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යයන ක්‍රමවේදයෙන් බැහැරව මාර්ගගත අධ්‍යයනය ඔස්සේ පාඨමාලාවන් පවත්වාගෙන යාමට ආයතනය කටයුතු කරන ලදී. ආරම්භයේදී මාර්ගගත ඉගෙනුම් වෙත යොමු වීමේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය විවිධ තාක්ෂණික ගැටලු රාශියකට මුහුණ දුන්න ද සියලු අධ්‍යයන වැඩසටහන් මාර්ගගත ඉගෙනුම් ක්‍රමය භාවිතයෙන් සුමටව ක්‍රියාත්මක කිරීමට ආයතනයට හැකි විය.2022 අධ්‍යයන වර්ෂයේ දී, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ සිසුන් බඳවා ගැනීම සිදු කෙරුණේ සහතික පත්‍ර පාඨමාලා හයක (06) පමණි. එයට ජපන් හා කොරියානු භාෂා සහතිකපත් පාඨමාලා දෙක (02) ද අලුතින් ඇතුළත් විය. අතිරේක භාෂා පාඨමාලාවක් ලෙස දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම සඳහා සිසුන් 124 දෙනෙකු ලියාපදිංචි වූ අතර කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් පන්ති පැවැත්වීමට බාධා ඇති විය. නමුත් දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව 16 - මූලික සහ දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව 15 - අන්තර්මධ්‍යම මාර්ගගත ඉගෙනුම් ක්‍රමය යටතේ පැවැත්විය. සහතිකපත් වැඩසටහන්වල පාඨමාලා පූර්ණ අනුපාතය 42% ක් විය.[1]



	වාර්ෂික ඇතුළත් කර ගැනීම					සුදුසුකම් ලත් සංඛ්‍යාව				
	2017	2018	2019	2020	2021	2017	2018	2019	2020	2021
ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව	1321	2283	1938	512	0	986	1523	0	1422	122
ඉංග්‍රීසි භාෂා පදනම් පාඨමාලාව	0	413	429	64	0	143	269	0	300	53
ගුරුවරුන් සඳහා ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව	0	48	52	0	0	55	25	0	44	0
කථන ඉංග්‍රීසි සහතිකපත් පාඨමාලාව	1933	580	383	0	0	1471	0	391	239	0
පාසල් හැරයන්නන් ඉංග්‍රීසි භාෂා කෙටිකාලීන පාඨමාලාව	54	342	507	213	113	45	101	390	444	76
පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව	0	412	423	0	327	336	275	347	148	178
දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - මූලික	405	327	427	284	170	203	0	196	261	167
දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම	145	157	110	0	122	109	104	115	96	96
ජපන් භාෂා සහතිකපත් පාඨමාලාව - මූලික	0	0	0	0	22	0	0	0	0	0
කොරියානු භාෂා සහතිකපත් පාඨමාලාව - මූලික	0	0	0	0	15	0	0	0	0	0

මූලාශ්‍රය රැස් කළ දත්ත, 2021, මා.ස.අ.ආ.

[1] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.

3.2 2022 වර්ෂයේ පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු

මානව සම්පත් අභිවර්ධන ආයතනය තුළ, පශ්චාත් උපාධි, උපාධි සහ ඩිප්ලෝමා හදාරන ශිෂ්‍යයින් ඔවුන් අදාළ අධ්‍යයන පාඨමාලාවේ අනිවාර්ය අංගයක් ලෙස වැඩමුළුවලට සහභාගී විය යුතුය. මෙම වැඩසටහන් ශිෂ්‍යයින්ගේ වෘත්තීය සංවර්ධනය ඉලක්ක කොටගෙන පවත්වනු ලබයි. දේශන මෙන් නොව වැඩමුළු මගින් වෘත්තිය ලෝකයට අවශ්‍ය මාතෘකා පිළිබඳ විවෘතව සාකච්ඡා කිරීමට සහ නව අදහස් ඉදිරිපත් කිරීමට සංවාදාත්මක සාකච්ඡා සඳහා දිරි ගන්වනු ලබයි. සහභාගීවන්නන්ට ගැටලු හමුවේ මුහුණ දීමේ දී ගැටලු නිරාකරණයට ඔවුන්ගේ දෘෂ්ටිය අනුව ගැටලු විසඳා ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ අදහස් හුවමාරු කර ගත හැක. නව කුසලතා දියුණු කර ගැනීමට වැඩමුළු උපකාරී වන අතර එය ශිෂ්‍යයින්ගේ ප්‍රගතිය කෙරෙහි උපකාරී වේ. ශිෂ්‍යයින්ට ඔවුන්ගේ ඉදිරිපත් කිරීමේ, නායකත්වයේ, සන්නිවේදනයේ, කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ කුසලතා වැඩි දියුණු කර ගත

හැකිය. තවද මෙම වැඩමුළු මගින් විවිධ පරිසරවල මෘදු කුසලතා සංවර්ධනය චිත්ත සංවේදීතාව සංවර්ධනය කිරීම, නිර්මාණශීලී සහ අවදානම් තීරණ ගැනීම් ඉගෙනුම, එක්ව වැඩ කරන්නේ කෙසේද යන්න පිළිබඳ ඇති දැනුවත්බව, සහ මිනිසුන් සමඟ සාකච්ඡා කිරීම දියුණු කිරීම, අන්‍යයන්ගෙන් සහ ඔවුන් තුළම ඇතිවන ආතතිය සහ ගැටුම් දුරලීම වැනි පුළුල් පරාසයක පැතිර ඇති මෘදු කුසලතා වර්ධනය කිරීමට පහසුකම් සපයයි.

2022 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය, ශිෂ්‍යයින්ගේ, රාජ්‍ය/පෞද්ගලික අංශවල සේවා නියුක්තිකයන්ගේ දැනුම, කුසලතා, ආකල්ප, වැඩි දියුණු කිරීමේ අරමුණින් පශ්චාද් උපාධි, ප්‍රථම උපාධි, සහ ඩිප්ලෝමා පාඨමාලාවල ලියාපදිංචිව සිටින සිසුන්ට මෙන්ම ආයතන සම්පත් සායකයින්ගේ මෙහෙයවීමෙන් පුහුණු වැඩමුළු, ජනතා දැනුවත් කිරීම් වැඩසටහන් මෙන්ම ජාත්‍යන්තර වැඩමුළු ද ඇතුළත්ව වැඩසටහන් 19 ක් පවත්වන ලදි.

වර්ගය	වැඩමුලුව	සහභාගි වූ සංඛ්‍යාව	ඉලක්ක කණ්ඩායම
වැඩමුළු	උපදේශනය සහ මනෝවිද්‍යාව පිළිබඳ වැඩමුළුව	80	උපදේශනය සහ මනෝවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා සිසුන් - අංක 04 සහ 05
	ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම පිළිබඳ වැඩමුළුව	187	ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා අපේක්ෂකයින් - 2019/20
	කළමනාකරණ මූලධර්ම සහ භාවිතයන් ඉදිරිපත් කිරීම	75	මානව සම්පත් කළමනාකරණාධිපති පාඨමාලා සිසුන් - 12/2022
	කළමනාකරණ මූලධර්ම සහ භාවිතයන් ඉදිරිපත් කිරීම	44	ව්‍යාපාර කළමනාකරණාධිපති පාඨමාලා සිසුන් - 10/2022
	ව්‍යාපෘති වාර්තා ප්‍රගතිය ඉදිරිපත් කිරීම	52	ව්‍යාපාර කළමනාකරණාධිපති පාඨමාලා සිසුන් - 09/2022
	ව්‍යාපෘති වාර්තා ප්‍රගතිය ඉදිරිපත් කිරීම	44	මානව සම්පත් කළමනාකරණාධිපති පාඨමාලා සිසුන් - 11/2022
	ව්‍යාපෘති වාර්තා ප්‍රගතිය ඉදිරිපත් කිරීම	57	මානව සම්පත් කළමනාකරණාධිපති පාඨමාලා සිසුන් - 12/2022
පුහුණු වැඩසටහන් /ක්ෂේත්‍ර නිරූපණය පැවැත්වීම	උපදේශන මනෝවිද්‍යාව පිළිබඳ ක්ෂේත්‍ර සංචාරය	76	උපදේශනය සහ මනෝවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා සිසුන් - අංක 04/05
	උපදේශන මනෝවිද්‍යාව පිළිබඳ ක්ෂේත්‍ර සංචාරය	42	උපදේශනය සහ මනෝවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා සිසුන් - අංක 04/05
	උපදේශන මනෝවිද්‍යාව පිළිබඳ ක්ෂේත්‍ර සංචාරය	38	උපදේශනය සහ මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා සිසුන් - අංක 05
	උපදේශන මනෝවිද්‍යාව පිළිබඳ ක්ෂේත්‍ර සංචාරය	50	උපදේශනය සහ මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමා සහ ඩිප්ලෝමා පාඨමාලා සිසුන් - අංක 04
	උපදේශන මනෝවිද්‍යාව පිළිබඳ ක්ෂේත්‍ර සංචාරය	24	උපදේශනය සහ මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමා සහ ඩිප්ලෝමා පාඨමාලා සිසුන් - අංක 04
	නායයැම් අවම කිරීම පිළිබඳ ක්ෂේත්‍ර චාරිකාව	18	ආපදා විශ්ලේෂණ කළමනාකරණ සහ පාලනය විද්‍යාපති පාඨමාලා සිසුන් - අංක 04

	ආපදා විශ්ලේෂණ කළමනාකරණ සහ පාලනය විද්‍යාපති පිළිබඳ ක්ෂේත්‍ර චාරිකාව	14	ආපදා විශ්ලේෂණ කළමනාකරණ සහ පාලනය විද්‍යාපති පාඨමාලා සිසුන් - අංක 04
	පිටතට යන පුහුණු වැඩසටහන	25	සේවා කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලා සිසුන් - අංක 05
	පිටතට යන පුහුණු වැඩසටහන	40	සේවා කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලා සිසුන් - අංක 05
වෙනත්	21 වැනි සියවසේ සිංහල නවකතා සංඛ්‍යාන කථිකාචාර්ය මාලාව	100	පුස්තකාලයාධිපතිවරුන් සහ සිංහල නවකතා ගැන උනන්දුවක් දක්වන සියලුමදෙනා
	පොත් සාකච්ඡාව - කෙටිකතා එකතුව ශ්‍රී ලංකා පුවත්පත් සභාව	100	සිංහල කෙටිකතාවලට සහ පොදුවේ සාහිත්‍යයට උනන්දුවක් දක්වන ජනතාව
	විශිෂ්ඨත්වය කරා කාර්යක්ෂමතාවය ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා මානව සම්පත් සංවර්ධන මූලධර්ම පිළිබඳ වැඩමුළුව	25	කොළඹ විශ්වවිද්‍යාලයේ නිති පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය

මූලාශ්‍රය රැස් කළ දත්ත, 2022, මා.ස.අ.ආ.

3.3 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

පර්යේෂකයාගේ නම	මාතෘකාව	ප්‍රකාශිත දිනය	ස්ථානය/ ප්‍රකාශනය
ආචාර්ය ඩබ්.එස්. චන්ද්‍රසේකර	*The effects of alcohol addiction of father on subjective wellbeing of his family members: views of his wife in rural families in srilanka.*		රජරට සමාජ විද්‍යා ජර්නලය
ඩී.එච්.ඩී නදීශා මිය (සමකතෘ - Jannie Poletti-Hughes)	*The Effectiveness of Gender Diversity Reforms and the Impact of a Familial Culture: A Spillover Effect on Board Independence*	2022	කළමනාකරණය පිළිබඳ බ්‍රිතාන්‍ය සඟරාව
ඩී.එච්.ඩී නදීශා මිය (සමකතෘ - Jannie Poletti-Hughes)	*Does board diversity decrease corporate fraud? International evidence from family vs.non-family firms*	2022	ආයතනික මූල්‍ය සමාලෝචනය
එම්.ඩබ්. එන්. ටී. වීරක්කොඩි මහතා	*Developing an informated workplace: Information Comminuication Technology adoption and Human Resource Management*	2022	IHRA සඟරාව
සි.එල්. ඒදිරිසිංහ මෙය (සමකතෘ මහාචාර්ය පි. කයිලාසපති මහත්මිය)	*To tell or Not to Tell: Individual Factors Related to Whistle-blowing Intention*	2022	නීතීය සහ කලමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සඟරාව
සි.එල්. ඒදිරිසිංහ මෙය (සමකතෘ - මහාචාරක්ධය පි. කයිලාසපති මහත්මිය)	*The thinking glass: Women's career development at the glass ceiling*	2022	සමාජ විද්‍යාවේ පර්යේෂණ සහ නවොත්පාදන පිළිබඳ ජාත්‍යන්තර සඟරාව
කේ.පි.එස්. සඳමාලි මිය	*A study of code- mixing and code-switching (English to Sinhala) in adolescent learners*	2022	භාෂා සහ භාෂා අධ්‍යයන සඟරාව
කේ.පි.එස්. සඳමාලි මිය	*Identification of Ramifications on Distance Learning related to English Language Learning of School Leavers*	2022	උසස් පර්යේෂණ සහ ප්‍රකාශන පිළිබඳ ජාත්‍යන්තර සඟරාව
ආර්.එම්.එස්.එන් රත්නායක මිය	*Collaboration and sharing Resources and services among Institute Libraries of the National Universities in Sri Lanka: with recommendations for improvement*	2022	ශ්‍රී ලංකා පුස්තකාලයේ සඟරාව

මූලාශ්‍රය රැස් කළ දත්ත, 2021, මා.ස.අ.ආ.

3.4 අධ්‍යයන, පරිපාලන, අධ්‍යයන සහය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු - 2022

තනතුරු නාමය	සේවාව	ශ්‍රේණිය/ පන්තිය	වැටුප් කේතය	සේවා කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව		පවතින කාර්ය මණ්ඩලය	
					ස්ථිර	කොන්ත්‍රාත්	ස්ථිර	කොන්ත්‍රාත්
ජ්‍යෙෂ්ඨ මට්ටම								
අධ්‍යක්ෂ	අධ්‍යයන		U-AC-5	1	01	–	01	–
මහාචාර්ය	අධ්‍යයන		U-AC-5	1			–	–
සහාය මහාචාර්ය	අධ්‍යයන		U-AC-4	1			–	–
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ කථිකාචාර්ය/ කථිකාචාර්ය (ආධුනික)	අධ්‍යයන		U-AC-3	1	11		08	–
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති	අධ්‍යයන	II/I	U-AC-3	1	01	–	01	–
නියෝජ්‍ය ලේඛකාධිකාරී	UA&FS	II/I	U-EX-2a	1	01	–	01	–
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	UA&FS	II/I	U-EX-2	1	01	–	01	–
නියෝජ්‍ය ලේඛකාධිකාරී	UA&FS	II/I	U-EX-2a	1	01	–	01	–
තෘතියික මට්ටම								
සහකාර ලේඛකාධිකාරී	UA&FS	II/I	U-EX-1	2	01	–	01	–
සහකාර මූල්‍යාධිකාරී	UA&FS	II/I	U-EX-1	2	01	–	01	–
විද්‍යාත්මක සහකාර	AS	II/I	U-AS 2	2	01	–	01	–
තොරතුරු තාක්ෂණ උපදේශක	AS	II/I	U-AS 2	2	01	–	01	–
ද්විතියික මට්ටම								
තාක්ෂණ නිලධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)	UTS	II/I	U-MT 1	3	06	–	–	–
කළමනාකරණ සහකාර	UMAS	III/II/I	U-MN 1	3	25	–	19	–
කළමනාකරණ සහකාර (පොත් තැබීම්)	UMAS	III/II/I	U-MN 1	3	01	–	01	–
කළමනාකරණ සහකාර (සරප්)	UMAS	III/II/I	U-MN 1	3	01	–	01	–
කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු)	UMAS	III/II/I	U-MN 1	3	01	–	01	–
පුස්තකාල තොරතුරු සහකාර	UMAS	III/II/I	U-MN 1	3	03	–	02	–
ප්‍රාථමික මට්ටම								
කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරු	දෙපාර්තමේන්තුගත	III/II/I/Spl	U-PL-1	4	01	–	01	–
රියදුරු	UDS	III/II/I/Spl	U-PL-3	4	03	–	03	–
බයිසිකල් පණිවිඩකරු	දෙපාර්තමේන්තුගත	III/II/I/Spl	U-PL-1	4	01	–	01	–
කාර්ය සහායක	UWAS	III/II/I/Spl	U-PL-1	4	07	–	05	–
පුස්තකාල සහායක	දෙපාර්තමේන්තුගත	III/II/I/Spl	U-PL-2	4	02	–	01	–
තාවකාලික විද්‍යාත්මක සහකාර	**කොන්ත්‍රාත්**	–	Fixed		–	01	–	–
වැඩසටහන් සහකාර	**කොන්ත්‍රාත්**	–	Fixed		–	25	–	19
කාර්ය සහායක	**කොන්ත්‍රාත්**	–	Fixed		–	03	–	–

මූලාශ්‍රය රැස් කළ දත්ත, 2022 , මා.ස.අ.ආ.

3.5 පුස්තකාලය

3.5.1 හැඳින්වීම


1975 වසරේ දී මානව සම්පත් අභිවර්ධන ආයතනය පුස්තකාල සේවා සම්පාදනය ආරම්භ කරන ලදී. වර්තමානයේ එය බෞද්ධාලෝක මාවතේ පිහිටි කොළඹ විශ්වවිද්‍යාලයීය මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ස්ථාපිත කර ඇත. පුස්තකාලය වර්ග මීටර් 70.4ක් අවරණය කරයි. ඉඩකඩ ප්‍රමාණයෙන් ඉතා කුඩා වුවත්, ආසන්න වශයෙන් පොත් 6770 ක් පමණ ඇති අතර එහි පරිශීලකයන්ට තවත් සේවාවන් ලබා දෙයි.

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පුස්තකාල ශ්‍රම කළමනාකරණවේදී උපාධි පාඨමාලාව, මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව, ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව, සේවා කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලාව (සිංහල/ඉංග්‍රීසි) හදාරන විද්‍යාර්ථීන් සහ උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමා/උසස් ඩිප්ලෝමා හදාරන ශිෂ්‍යයින් සඳහා ප්‍රධානතම සම්පතකි. මෙම ශිෂ්‍ය අවශ්‍යතා පූරණය කිරීම සඳහා සේවාවන් සහ ආධාරක සපයයි. සතියේ දිනවල පෙරවරු 9.00 සිට සවස 4.00 දක්වා විවෘතව පවතී.

3.5.2 පුස්තකාල සාමාජිකයින්

ශ්‍රම කළමනාකරණවේදී උපාධි පාඨමාලාව	394
මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව	160
ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව	95
සේවා කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලාව	258
උපදේශන මනෝවිද්‍යා පාඨමාලාව	209
අධ්‍යයන කාර්ය මණ්ඩලය (ස්ථිර)	06
අනධ්‍යයන (ස්ථිර)	34
එකතුව	**1,156**

3.5.3 පුස්තකාලය සපයන සේවාවන්



3.5.4 පුස්තකාල එකතුව

3.5.4.1 ග්‍රන්ථ

ග්‍රන්ථ එකතුව (2021)		7249
2022 වසරේදී මිලදී ගත් පොත් ගණන		4
වියදම් කළ මුදල -	රු.	8965.00
2022 වසරේදී පුස්තකාලයට පරිත්‍යාග කළ සංඛ්‍යාව		2
		7255
2022 වසරේදී ඉවත් කරන ලද පොත් සංඛ්‍යාව		(74)
2022 වසරේදී හානියට පත් වූ සහ ලේඛනයෙන් ලියා ඇති පොත් සංඛ්‍යාව		(412)
		(486)
2022 වසරේදී මුලු පොත් සංඛ්‍යාව		**6769**

3.5.4.2 වාර සඟරා

පුවත්පත්

දෛනික	සතිඅන්ත
Daily News	ඉරිදා ලංකාදීප
ලංකාදීප	ඉරිදා මවුබිම
	Sunday Times
	Sunday Observer
	සිළුමිණ

පුවත්පත් සඳහා වියදම් කළ මුදල රු. 58,070.00

3.5.4.3 පුස්තකාල ක්‍රියාකාරකම් ස්වයංක්‍රිය කිරීම සහ පුස්තකාල ද්‍රව්‍ය ඩිජිටල්කරණය කිරීම

පුස්තකාල කාර්යයන් ස්වයංක්‍රිය කිරීම සහ පුස්තකාල ද්‍රව්‍ය ඩිජිටල්කරණය කිරීම 2019 දී ආරම්භ කරන ලද අතර 2021 අවසානයේ පද්ධතිය පරීක්ෂා කරන ලදී. පොත් 4139 ක ග්‍රන්ථ නාම දත්ත සහ සාමාජිකයින්ගේ දත්ත 217 ක් ඇතුළත් කරන ලදී. සිසුන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ඩිජිටල් පුස්තකාල සමාජික කාඩ්පත නිකුත් කරන ලදී පසුගිය ලිපි ලේඛනවල අවශ්‍ය පොත්වල අන්තර්ගත පිටු සහ ව්‍යාපෘති වාර්තාවල සාරාංශ උඩුගත කරන ලදී.

3.5.4.4 ආදායම

නැති වූ පොත්	- රු. 213.45
පුස්තකාල දඩ මුදල	- රු. 13,970.00
මුලු මුදල	**- රු. 14,183.45**

3.5.4.5 වත්කම් මිලදී ගැනීම

නැවත ආරෝපණය කළහැකි මේස ලාම්පු	02
බාහිර දෘඪ තැටිය	06

පුස්තකාල කමිටු රැස්වීම්

78 වෙනි රැස්වීම	-	2022 ජනවාරි 25
79 වෙනි රැස්වීම	-	2022 ජූනි 08
80 වෙනි රැස්වීම	-	2022 නොවැම්බර් 15

පුස්තකාල භාවිතය

වර්ෂය තුළ සාමාජිකයින්ගේ මාසික පැමිණීම මසකට 53 ක් පමණ විය (පසුගිය වසර තුළ මසකට 5) මාසික පොත් සංසරණය 30ක් පමණ විය. (පසුගිය වසර තුළ මසකට 6) 2021 හා සසඳන විට සාමාජිකයින්ගේ පැමිණීම වැඩි වී ඇත. 2021 හා සසඳන විට සමාජිකයින්ගේ පැමිණීම 960% කින් සහ 2022 දී මාසික සංසරණය 400% කින් වැඩි වී ඇත. රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් පළමු මාස 7 තුළ (ජනවාරි සිට ජූලි දක්වා) පුස්තකාල භාවිතය අවම වූ නමුත් අගෝස්තු මාසයෙන් පසුව එය සීඝ්‍රයෙන් වර්ධනය විය.

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2022

1 ආයතනික තොරතුරු

1.1 වාර්තා කිරීමේ ආයතනය - නීත්‍ය හා නෛතික ආකෘතිය

304100-10367-R003	S/ C Rec, Diploma Course In Tamil No.15 (Basic), Course Fee	68,110.00
304100-10370-R003	S/ C Rec, Msc In Disaster Analysis,Anagement & Mitigation, C	1,915,459.49
304100-10371-R003	S/ C Rec, Dip.In Drugs Abuse Mgt Studies 2020, Course Fee	657,958.00
304100-10374-R003	S/ C Rec, Dip.In Tourisum, Eve & Hos. Mgt.2020, Course Fee	509,555.00
304100-10375-R003	S/ C Rec, Dip.In Counseling Psychology No.08, Course Fee	2,972,673.62
304100-10376-R003	S/ C Rec, Higher Dip.In Counseling Psychology 2020, Course F	2,490,099.81
304100-10379-R003	S/ C Rec, Cert.Co.In Computer App. No.12, Course Fee	1,614,459.23
304100-10381-R003	S/ C Rec, Diploma Course In Tamil No.16 (Itermedite), Cours	370,073.00
304100-10382-R003	S/ C Rec, Short Course In English For School Leavers No.28,	123,232.72
304100-10383-R003	S/ C Rec, Foundation Co.In English No.08, Course Fee	80,712.50
304100-10384-R003	S/ C Rec, Diploma In Service Management 2021, Course Fee	3,087,803.00
304100-10385-R003	S/ C Rec, Diploma Course In Tamil No.15 (Higher), Course Fe	837,126.83
304100-10386-R003	S/ C Rec, Dip.In Counseling Psychology No.09 .2021, Course F	5,957,282.37
304100-10387-R003	S/ C Rec, Higher Dip.In Counseling Psychology 2021, Course F	3,912,173.42
304100-10388-R003	S/ C Rec, Msc In Serviice Mgt- No 07 - 2021, Course Fee	7,280,850.50
304100-10389-R003	S/ C Rec, Certificate Co. In Basic Japanese Lang.2021, Cours	264,250.00
304100-10390-R003	S/ C Rec, Dip.In Drugs Abuse Mgt Studies 2021, Course Fee	665,811.66
304100-10391-R003	S/ C Rec, Certificate Course In English No.41, Course Fee	1,708,448.00
304100-10392-R003	S/ C Rec, Certificate Co. In Basic Korean Lang.2021, Course	106,175.00
304100-10393-R003	S/ C Rec, Diploma Course In Tamil No.17 (Basic), Course Fee	616,728.00
304100-10394-R003	S/ C Rec, Short Course In English For School Leavers No.29,	431,228.00
304100-10395-R003	S/ C Rec, Bachelor Of Labour Education 2021, Course Fee	724,800.00
304100-10397-R003	S/ C Rec, Masters Of Business Management No.10, Course Fee	5,129,550.00
304100-10398-R003	S/ C Rec, Masters Of Human Resourse Mgt No.12, Course Fee	11,866,850.00
304100-10399-R003	S/ C Rec, Msc In Serviice Mgt- No 05 -Sin M - 2021, Course F	4,131,209.80
304100-10400-R003	S/ C Rec, Ex. Dip.In Tourisum, Eve & Hos. Mgt.2021, Course F	305,790.00
304100-10401-R003	S/ C Rec, Course In English For School Leavers No.30, Course	600,486.00
304100-10402-R003	S/ C Rec, Cert.Co.In Computer App. No.13 - 2022, Course Fee	2,582,017.65
304100-10403-R003	S/ C Rec, Cert..In Basic Japanese No.02, Course Fee	381,550.00
304100-10404-R003	S/ C Rec, Cert..In Intermediate Japanese No.01, Course Fee	184,500.00
304100-10406-R003	S/ C Rec, Cert..In Basic Korean No.02, Course Fee	380,300.00
304100-10407-R003	S/ C Rec, Cert..In Intermediate Korean No.01, Course Fee	223,300.00
304100-10409-R003	S/ C Rec, Foundation Co.In English No.09, Course Fee	217,454.00
304100-10410-R003	S/ C Rec, Certificate Course In English No.42, Course Fee	2,598,883.74
304100-10411-R003	S/ C Rec, Diploma Course In Tamil No.16 (Intermedite), Cour	78,340.00
304100-10414-R003	S/ C Rec, Diploma In Service Management 2022 No 07, Course F	573,567.00
304100-10415-R003	S/ C Rec, Higher Diploma In Service Management 2022 No 01, C	1,051,820.00
304100-10416-R003	S/ C Rec, Postgraduate Diploma In Service Management 2022 No	8,960.00
304100-10417-R003	S/ C Rec, Msc In Serviice Mgt- No 08 -En M. - 2022, Course	638,265.89
304100-10419-R003	S/ C Rec, Foundation Co.In English No.10, Course Fee	758,040.00
304100-10420-R003	S/ C Rec, Short Course In English For School Leavers No.31,	764,568.50
304100-10422-R003	S/ C Rec, Higher Dip.In Counseling Psychology 2022 (Batch Ii	2,020,487.33
304100-10423-R003	S/ C Rec, Dip.In Counseling Psychology No.10 .2023, Course F	130,255.00
304100-10424-R003	S/ C Rec, Diploma Course In Tamil No.18 (Basic), Course Fee	148,000.00
304100-10425-R003	S/ C Rec, Cert.Co.In Computer App. No.14 - 2022 (Batch 02),	838,696.12
304100-10426-R003	S/ C Rec, Cert.Co. In Basic Japanese Lang. No.03, Course Fe	494,920.00
304100-10427-R003	S/ C Rec, Cert.Co. In Intermediate Japanese Lang. No.02, Cou	467,140.00
304100-10428-R003	S/ C Rec, Cert.Co. In Basic Korean Lang. No.03, Course Fee	445,520.00
304100-10429-R003	S/ C Rec, Cert.Co. In Intermediate Korean Lang. No.02, Cours	430,320.00
304100-10436-R003	S/ C Rec, Master Of Human Resource Management 13/2023, Cours	27,000.00
304100-10437-R003	S/ C Rec, Master Of Business Management 11/2023, Course Fee	200,000.00
304200-20034	Diploma Aw arding Ceromony	1,571,400.00
එකතුව		**103,289,470**

සටහන 20 - වෙනත් ආදායම් ප්‍රකාශය

සටහන 04 - මුදල් සහ මුදල් සමතුලනයන්	අගය
ලියාපදිංචි ගාස්තු - උපාධි අපේක්ෂක	340ල500
විභාග ගාස්තු - උපාධි අපේක්ෂක	151,200
ණය සහ අත්තිකාරම්වලින් ලද පොළිය	296,255
කෙටි කාලීන තැන්පත් පොළිය	75,976,479
පැරණි කොටස් විකිණීම/ඉවතලන දේ විකිණීම	450
ටෙන්ඩර් ගාස්තු	13,500
පුස්තකාල දඩ	16,764
ආයෝජන පොලී	1,974,318
විවිධ ලැබීම්	1,963,399
ශිෂ්‍ය විභාග ගාස්තු පශ්චාත් උපාධි පාඨමාලාව	839,600
උපාධි ලෝගු කුළියට දීම්	863,175
එකතුව	**82,435,641**

සටහන 21 - වියදම් ප්‍රකාශය

ගිණුම් අංකය	විස්තරය	අගය	tl;=j
පුද්ගලික දීමනා (අධ්‍යයන)			
410101-90000-P001	වැටුප් හා වේතන	9,670,378.79	
410101-90000-P002	සේවක අර්ථසාධක අරමුදල්	2,787,270.07	
410101-90000-P003	විශ්‍රාම	1,483,695.72	
410101-90000-P004	සේවක භාරකාර අරමුදල්	854,193.18	
410101-90000-P005	වැඩබලන වැටුප්	149,621.25	
410101-90000-P007	එම්.සී.ඒ.	824,472.00	
410101-90000-P008	අධ්‍යයන දීමනා	14,962,461.08	
410101-90000-P010	වෙනත් දීමනා	5,000.00	
410101-90000-P011	බාහිර දේශන ගාස්තු	1,432,812.00	
410101-90000-P012	පාරිතෝෂික	314,170.79	
410101-90000-P013	ජීවන වියදම් දීමනාව	1,275,202.00	
410101-90000-P014	හිඟ මුදල් එම්.සී දීමනාව	14,104.15	
410101-90000-P015	පර්යේෂණ දීමනාව	3,234,605.09	
410101-90000-P016	විශේෂ දීමනා 15%	2,320,121.24	
410101-90000-P020	අමතර දීමනා	681,833.33	
410101-90000-P021	සන්නිවේදන දීමනා	85,000.00	
410101-90000-P022	ඉන්ධන දීමනා	708,615.00	
410101-90000-P023	ප්‍රවාහන දීමනා	600,000.00	
410101-90000-P024	විනොදාස්වාද දීමනාව	188,036.10	
පුද්ගලික දීමනා (අනධ්‍යයන)			
410102-90000-P001	වැටුප් හා වේතන	22,423,666.72	
410102-90000-P002	සේවක අර්ථසාධක අරමුදල්	2,762,269.33	
410102-90000-P003	විශ්‍රාම	2,243,247.71	
410102-90000-P004	සේවක භාරකාර අරමුදල්	1,001,103.96	
410102-90000-P005	වැඩබලන වැටුප්	825,023.25	
410102-90000-P007	එම්.සී.ඒ.	8,197,279.40	
410102-90000-P010	වෙනත් දීමනා	55,000.00	
410102-90000-P012	පාරිතෝෂික	846,390.80	
410102-90000-P013	ජීවන වියදම් දීමනාව	3,657,445.16	
410102-90000-P014	එම්.සී.ඒ.	198,868.91	
410102-90000-P015	පර්යේෂණ දීමනාව	1,131,835.48	
410102-90000-P016	විශේෂ දීමනා 20%	4,098,288.48	
410102-90000-P017	අතිකාල	431,460.17	
410102-90000-P020	අමතර දීමනා	2,344,516.13	
410102-90000-P021	සන්නිවේදන දීමනා	110,000.00	91,917,987.29
සැපයුම්			
410106-90000-P031	ලිපිද්‍රව්‍ය සහ කාර්යලයීය අවශ්‍යතා	1,487,227.00	
410106-90000-P032	ඉන්ධන සහ ලිහිසි තෙල්	973,457.17	
410106-90000-P033	නිල ඇඳුම් සහ මැහුම් ගාස්තු	146,146.00	
410106-90000-P034	යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ	43,506.20	
410106-90000-P036	වෙනත් සැපයුම්	2,539,804.01	5,190,140.38
නඩත්තු			
410107-90000-P040	රථවාහන	422,898.32	
410107-90000-P041	යන්ත්‍රෝපකරණ සහ උපකරණ	1,041,332.00	
410107-90000-P043	ගෘහභාණ්ඩ	31,393.16	
410107-90000-P044	වෙනත්	2,424,131.92	3,919,755.40
ගිවිසුම්ගත සේවා			
410108-90000-P050	ප්‍රවාහන	369,199.00	
410108-90000-P051	සන්නිවේදන කාර්‍යාණය	862,601.34	
410108-90000-P052	තැපැල් ගාස්තු	96,404.00	
410108-90000-P053	විදුලිය	1,921,641.44	
410108-90000-P054	ආරක්‍ෂක සේවා	2,135,866.15	
410108-90000-P055	ජලය	82,706.87	
410108-90000-P056	පිරිසිදු කිරීමේ සේවාව	1,083,194.76	
410108-90000-P057	කුළි සහ කුළියට ගැනුම්	793,500.00	
410108-90000-P058	පළාත් පාලන ආයතන වෙත ගාස්තු සහ බදු	249,480.00	
410108-90000-P059	මුද්‍රණ ප්‍රචාරණ වෙනත්	215,717.00	
410108-90000-P060	වෙනත්	254,089.30	8,064,399.86
වෙනත් ප්‍රතිරාවර්ථන වියදම්			
410109-90000-P062	විශේෂ සේවා - පාලක සභාව සහ කමිටු	2,020,580.00	
410109-90000-P064	වැඩමුළුව , සම්මන්ත්‍රණය	549,000.00	
410109-90000-P068	නිවාඩු වවුචර්පත් සහ වාර ප්‍රවේශපත්‍ර	295,035.00	
410109-90000-P069	සංග්‍රහ වියදම්	1,782,100.74	
410109-90000-P070	බැංකු ගාස්තු	435.90	
410109-90000-P071	සම්මාන සහ වන්දි	137,500.00	
410109-90000-P073	සම්මන්ත්‍රණය	252,500.00	
410109-90000-P074	විභාග වියදම්	1,674,035.00	
410109-90000-P075	වෙනත් වියදම් (පුවත්පත් සඟරා)	1,196,056.45	
410109-90000-P079	සුභසාධන රක්‍ෂණය	943,893.10	
410109-90000-P084	දේපළ ණය පොළිය	33,220.25	8,884,356.44
පාගවීම් ගිණුම			
420101	ඉඩම් සහ ගොඩනැගිලි	4,227,341.48	
420102	කාර්යාල උපකරණ	6,726,958.76	
420103	පුස්තකාල පොත් සහ සඟරා	12,660.21	
420104	රථවාහන	1,910,000.00	
420106	නාමපුවරු	43,198.08	
420107	උපාධි ලේඛ	234,192.24	
420108	ගෘහභාණ්ඩ	1,717,467.78	
420109	විදුලි උපකරණ	3,073,737.09	
420110	මෘදුකාංග	354,730.31	18,300,285.95
එකතුව			136,276,925.32

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ෂෂෂ වන කොටසේ අංක 17 (ඇ) යටතේ දක්වා ඇති තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව - 2022

1 හැඳින්වීම

මානව සම්පත් අභිවර්ධන ආයතනය, 1979 අංක 11 නියමාවලිය මගින් සේවක අධ්‍යාපන ආයතනය නමින් ස්ථාපිත කරන ලද අතර එය වර්ෂ 2006 අංක 01 නියමාවලිය මගින් සංශෝධනය කරනු ලැබිණ. 2006 වසරේදී සේවක අධ්‍යාපන ආයතනය මානව සම්පත් අභිවර්ධන ආයතනය ලෙස නම් කරන ලද අතර 2021 අංක 01 දරන නව නියමාවලිය 2021 මාර්තු මස 16 වන දින සිට ක්‍රියාත්මක වේ. මානව සම්පත් අභිවර්ධන ආයතනය රටේ පැරණිතම විශ්වවිද්‍යාලය වන කොළඹ විශ්වවිද්‍යාලයට අයත් අධ්‍යයනායතනයකි. කොළඹ විශ්වවිද්‍යාලීය අධ්‍යයන ආයතනයක් වීම තුළ ආයතනයේ අධ්‍යයන කටයුතු කොළඹ විශ්වවිද්‍යාලයේ දැඩි අධීක්ෂණයට ලක්වේ. ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයක් පවත්වා ගත යුතු අධ්‍යයන කටයුතුවල උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ යහපත් සම්ප්‍රදායන් ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය බැඳී සිටී.

මානව සම්පත් අභිවර්ධන ආයතනය 2018 - 2022 කාල පරාසය සඳහා ආයතන සංයුක්ත සැලැස්ම සැකසීමේ සිට ක්‍රියාකාරී සැලැසුම් තුළින් අපේක්ෂිත අරමුණු ඉලක්ක කරා ගමන් කරමින් සිටී. සෑම රාජ්‍ය ආයතනයක් මෙන්ම මානව සම්පත් අභිවර්ධන ආයතනය ද එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය අනුව, තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම වෙනුවෙන් අපගේ ආයතනික අරමුණු සහ ඉලක්කද කේන්ද්‍රගත කොට ඇති බව සතුටින් දැනුම් දීමට කැමැත්තෙමු. අපගේ 2018 - 2022 ආයතන සංයුක්ත සැලැස්ම ප්‍රධාන වශයෙන් ගුණාත්මක අධ්‍යාපනය, පරිසරය සුරැකීම සහ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව යන අංගයන් වෙත අපගේ මූලික අවධානය යොමු කොට ඇත.

2 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2018 - 2022 කාල පරාසය සඳහා වූ සංයුක්ත සැලැස්මට අනුව ආයතනික ඉලක්ක සහ අරමුණු

	ඉලක්කය	අරමුණු
01	**උසස් අධ්‍යාපනයට සමාන ප්‍රවේශයක් සහ පුළුල් සහභාගිත්වය**	• විශේෂයෙන් උසස් අධ්‍යාපනය සඳහා විධිමත් අධ්‍යාපනයක් ලබා ගත නොහැකි පුද්ගලයන් දැනුවත් කිරීම. • මාර්ගගත ඉගෙනුම්-ඉගැන්වීම් අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීමේ හැකියාව වැඩි කිරීම.
02	**අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදාළත්වය වැඩි දියුණු කිරීම**	• ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් ඇති කිරීම. • කාර්මික අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩසටහන් වැඩි දියුණු කිරීම. • අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදාළත්වය වැඩි දියුණු කිරීම සඳහා උපාධි ගුණාංග වැඩි දියුණු කිරීම.

03	**පර්යේෂණ, නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීම**	• විද්වතුන් හා විද්‍යාර්ථීන් අතර පර්යේෂණ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම. • පර්යේෂණ සහ සංවර්ධනය සඳහා අධාර කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. • විශිෂ්ට පුස්තකාල සේවාවක් පුරුදු කිරීම.
04	**සමාජ ආර්ථික සංවර්ධනයේදී උපාය මාර්ගික හවුල්කාරිත්වය වැඩි කිරීම**	• රාජ්‍ය හා පෞද්ගලික අංශයේ අවශ්‍යතා සඳහා දැනුම පැවරීම. • ප්‍රජාවන්ගේ යහපත උදෙසා ශාස්ත්‍රීය දැනුම සහ අත්දැකීම් හුවමාරු කොට ගෙන ප්‍රයෝජනයට ගැනීම.
05	**ජාත්‍යන්තර සහයෝගීතාව සහ තරගකාරිත්වය වැඩි කිරීම**	• උසස් අධ්‍යාපනයේ ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම. • හවුල්කාරිත්වයන් ගොඩ නගා ගැනීමෙන් වර්ධනය සහ විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීම.
06	**භෞතික හා සෞන්දර්ය පරිසරය වැඩි දියුණු කිරීම තුළින් පාර්ශවකරුවන්ගේ සංතෘප්තිය**	• යහපත් පරිසරයක් සම්පාදනය සඳහා භෞතික පහසුකම් පුළුල් කිරීම. • සොබාදහම සංරක්ෂණය පෙරදැරි කොට ගෙන ප්‍රසන්න වාතාවරණයක් ඇති කිරීම. • සේවක තෘප්තිය වැඩි කිරීම.
07	**පරිපාලන පද්ධතිය සහ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම**	• ආයතනය තුළ පිරිසිදු භාවිතයන් උපයෝජනය කිරීම. • ශිෂ්‍ය කේන්ද්‍රීය විශිෂ්ට පරිපාලන ක්‍රියාවලියක් පුරුදු කිරීම. • විශිෂ්ට කාර්යාල පරිපාලන පද්ධතියක් පුරුදු කිරීම. • ආයතනයේ ගුරුවරුන්ට මෙන්ම ශිෂ්‍යයින්ට සහ පර්යේෂකයින්ට සහාය වීම සඳහා පහසු ප්‍රවේශයක් සහ තොරතුරු සේවාවන් සැපයීම. • සේවක කැපවීම වැඩි දියුණු කිරීම.
08	**මූල්‍ය කළමනාකරණය සහ තිරසාරබව වැඩි දියුණු කිරීම**	• වැඩසටහන්වලින් ආදායම වැඩි දියුණු කර ආයතනයට මූල්‍ය ප්‍රතිලාභ අත් කර දීම. • සියලු ප්‍රධාන ක්‍රියාවලින්හි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ වැඩසටහන් ඉදිරිපත් කිරීමේ පිරිවැය අවම කිරීම. • ආයතනයට අනාගත මූල්‍ය ප්‍රතිලාභ ලබා දීම සඳහා ප්‍රාග්ධනය සහ අනෙකුත් උපායමාර්ගික ආයෝජන ව්‍යාපෘති කළමනාකරණය කිරීම.
09	**යහපාලනය පුළුල් කිරීම**	• යහපාලනතන්ත්‍රය ස්ථාපිත කිරීම.

ඒ අනුව පසුගිය 2022 වසර තුළ ආයතන ක්‍රියාකාරී සැලැස්ම මගින් බලාත්මක කෙරුණු තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව මෙසේ එළි දක්වමු. එම ළඟා කර ගැනීම් පහත පරිදි වේ.

ශ්‍රම කළමනාකරණවේදි උපාධි පාඨමාලාව සාර්ථකව පවත්වාගෙන යාම

■ ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ 5 වෙනි ස්ථරයට අනුකූලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් ශ්‍රම කළමනාකරණවේදී උපාධි පාඨමාලාවේ දෙවන විද්‍යාර්ථීන් කණ්ඩායම 2022 වසරේදී ලියාපදිංචි කර ගැනීමට ආයතනය සමත් විය.

උපදේශන මනෝවිද්‍යා නව ප්‍රථම උපාධි පාඨමාලාවේ අතුරු ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුමැතිය ලබා ගැනීම.

■ ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ 5 සහ 6 වෙනි ස්ථරයට අනුකූලවන පරිදි සකස් කළ උපදේශන මනෝවිද්‍යා නව ප්‍රථම උපාධි පාඨමාලාවේ අතුරු ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට කොළඹ විශ්වවිද්‍යාලයීය පාලක සභාවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම. ඒ අනුව එම පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදු වෙමින් පවතී.

පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා වැඩසටහන්වලට අදාළ අතුරු ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුමැතිය ලබා ගැනීම.

■ ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ 8 වෙනි ස්ථරයට අනුකූලවන පරිදි සකස් කළ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා අතුරු ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට කොළඹ විශ්වවිද්‍යාලයීය පාලක සභාවෙන් අනුමැතිය ලබා ගැනීමට හැකි වීම. ඒ අනුව සේවා කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, මානව සම්පත් සංවර්ධන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ උපදේශන මනෝවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව යන පාඨමාලාවන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදු වෙමින් පවතී.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී අන්තර් ක්‍රියාකාරි ක්‍රම ප්‍රවර්ධනය කිරීම.

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පවත්වනු ලබන ශ්‍රම කළමනාකරණවේදි වැඩසටහන, සියලු පශ්චාත් උපාධි වැඩසටහන්, සියලු උසස්/ විධයක ඩිප්ලෝමා සහ ඩිප්ලෝමා පාඨමාලා මෙන්ම සහතික පත්‍ර වැඩසටහන්වල සාර්ථකව ක්‍රියාත්මක වේ.

ඉගෙනුම් කළමනාකරණ පද්ධතියේ භාවිතය පුළුල් කිරීම.

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පවත්වනු ලබන සහතිකපත් පාඨමාලාවන් හැරුණු කොට ශ්‍රම අධ්‍යාපනවේදි වැඩසටහන, සියලු ශාස්ත්‍රපති උපාධි වැඩසටහන්, සියලු උසස්/ විධයක ඩිප්ලෝමා සහ ඩිප්ලෝමා පාඨමාලා යන අනෙක් සෑම පාඨමාලාවකම ලියාපදිංචි වන සෑම ශිෂ්‍යයෙක්ම ඔවුනගේ අධ්‍යයන අවශ්‍යතා සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය භාවිත කිරීම අනිවාර්ය වේ.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා මිශ්‍ර ඉගෙනුම් (Blended Learning System) ක්‍රමය භාවිත කිරීම.

කථිකාචාර්යවැරුන් සියලුම අධ්‍යයන වැඩසටහන්වල මිශ්‍ර ඉගෙනුම් (Blended Learning System) ක්‍රමය භාවිතයෙන් තම දේශන පවත්වාගෙන යනු ලබයි. උදාහරණයක් ලෙසින් ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි වැඩසටහනේ දී;

- වර්තමානයේ සියලුම කථිකාචාර්යවරුන් තම විෂයන්ට අදාළ දේශන මිශ්‍ර ඉගෙනුම් (Blended Learning System) ක්‍රමය භාවිතයෙන් සිදු කිරීම.
- පැවරුම් ඉදිරිපත් කිරීම ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය හරහා සිදු කෙරේ.
- මුද්‍රිත ඉගෙනුම් අධාරක ලබා නොදේ. ඉගෙනුම් අධාරක ලබා ගැනීම සඳහා සිසුන් අදාළ ඉගෙනුම් කළමනාකරණ පද්ධති ගිණුමට ප්‍රවේශ විය යුතුය. (උදා: පැවරුම්, සටහන්, වීඩියෝ, ප්‍රශ්නාවලි - ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය උඩුගත කෙරේ.)
- දේශන සඳහා ශිෂ්‍ය සහභාගිත්වය ඩිජිටල් සහභාගිත්ව ක්‍රමවේදයක් වන ඕෆුස් ක්‍රමය ඔස්සේ ලබා ගැනේ.

අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පශ්චාත් උපාධි පුහුණුව ලබා දීම

අධ්‍යයන කාර්ය මණ්ඩල එක් සාමාජිකයෙක් විදේශගතව පශ්චාත් උපාධි අධ්‍යයනය කටයුතුවල නියැලෙමින් සිටින අතර තවත් සාමාජිකයෙක් පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා විදේශගත විය.

පර්යේෂණ ප්‍රතිඵල පුළුල් ලෙස ව්‍යාප්ත කිරීම.

ආයතනයේ කථිකාචාර්යවරු 5 දෙනෙක් විමර්ශිත ජර්නලවල තම පර්යේෂණ පත්‍රිකා 09ක් ප්‍රකාශයට පත් කොට ඇත.

විශිෂ්ට පුස්තකාල සේවාවක් ක්‍රියාත්මක කිරීම.

පුස්තකාල තොරතුරු පද්ධතිය සහ ඩී-අවකාශ මෘදුකාංගය ස්ථාපනය කිරීම අවසන් කොට ඇත.

ප්‍රජාවන්ගේ යහපත උදෙසා ශාස්ත්‍රීය දැනුම සහ අත්දැකීම් භුවමාරු කොටගෙන ප්‍රයෝජනයට ගැනීම.

ප්‍රජා සංවර්ධන වැඩසටහන් ලෙස පහත සඳහන් වැඩමුළු සඳහා ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය තම සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

වැඩමුළුව	**සම්පත් දායකත්වය**	**ඉලක්කගත ග්‍රාහක කණ්ඩායම**
21වන සියවසේ සිංහල නවකථා-සංකථන දේශන මාලාව - ශ්‍රී ලංකා පුස්තකාල සංගමය	ආර්.එම්.එස්.එන්. රත්නායක මහත්මිය, පුස්තකාලාධිපති, මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය	පුස්තකාලාධිපතිවරුන් සහ සිංහල නවකථා සඳහා කැමැත්තක් දක්වන පිරිස

කෙටිකථා ග්‍රන්ථ සාකච්ඡාව - ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය	ආර්.එම්.එස්.එන්. රත්නායක මහත්මිය, පුස්තකාලාධිපති, මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය	සිංහල කෙටිකථා සඳහා කැමැත්තක් දක්වන පිරිස
විශිෂ්ටත්වය කරා කාර්යක්ෂමතාව: ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා මානව සම්පත් මූලධර්ම වැඩමුළුව	සී.එල්. එදිරිසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය	අනධ්‍යයන කාර්ය මණ්ඩලය, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

පරිසර හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම.

බලශක්ති ඉතිරි කිරීමට මුලපිරීම සඳහා ආයෝජනය කිරීම විදුලි පහන් සඳහා LED සහ CFL බල්බ භාවිතය වැඩි කිරීම, මුද්‍රණ යන්ත්‍ර භාවිතය අඩු කිරීම, ඒකක සඳහා මුද්‍රණ යන්ත්‍ර භාවිතය, ආයතන පරිශ්‍රය තුළ ප්ලාස්ටික්-පොලිතින් භාවිතය අවම කිරීම සඳහා ක්‍රියා කිරීම, කසල බැහැර කිරීමේදී අපද්‍රව්‍ය දිරාපත් වන සහ නොවන ලෙස වෙන් කිරීමේ වැදගත්කම පිළිබඳව සේවක දැනුවත්භාවය වැඩි කිරීම.

සෞඛ්‍ය හා ආරක්ෂණ පියවර දියුණු කිරීම

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණාවරණයක් උපයෝජනය කිරීම.

විශිෂ්ට ශිෂ්‍ය-කේන්ද්‍රීය පරිපාලන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම.

මාර්ගගත ශීෂ්‍ය ලියාපදිංචි කිරීමේ ක්‍රමය සහ මුදල් ගෙවීමේ (payment gateway) පද්ධතිය මෙන්ම විද්‍යුත් ප්‍රතිචාර (e-response) පද්ධතිය දියත් කිරීම.

විශිෂ්ට කාර්යාල පරිපාලන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම.

ස්ථාවර වත්කම් ලේඛනය පරිගණකගත කිරීම, ඒකක භාණ්ඩ ලේඛන සම්පූර්ණ කිරීම, සියලු අංශ සඳහා රැකියා පිරිවිතර සම්පූර්ණ කිරීම නිත්‍යගත කළ තාප්‍රණික ඇගයීම් කමිටු සහ ඍජු ප්‍රසම්පාදන කමිටු රැස්වීම් සහ ක්‍රියා පටිපාටි සම්පූර්ණ කිරීම.

අධ්‍යයන ආයතනයක් ලෙස මානව සම්පත් අභිවර්ධන ආයතනය ඉහත කර්තව්‍යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් තිරසාර සංවර්ධන ඉලක්ක අනුගමනය කිරීමට පියවර ගෙන ඇත.

ඉලක්ක 04	සියල්ලන්මට පුළුල් සාධාරණ, සමාන මෙන්ම ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සියලු දෙනාට යාවජීව ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම.
ඉලක්ක 08	සියල්ලන්මට පුළුල් සහ තිරසර වූ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ හා ඵලදායී රැකියා සහ යහපත් රාජකාරී ප්‍රවර්ධනය කිරීම

ඉලක්ක 09	ඔරොත්තු දෙන යටිතල පහසුකම් ගොඩ නැගීම, පුළුල් හා තිරසාර කාර්මිකරණය ප්‍රවර්ධනය කිරීම හා නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම
ඉලක්ක 11	නගර හා ජනාවාස පූළුල්ව ආරක්‍ෂිත, ඔරොත්තු දෙන තිරසාර බවට පත් කිරීම.
ඉලක්ක 16	තිරසාර සංවර්ධනය සඳහා සාමය සහ පුළුල් වූ සමාජ ප්‍රවර්ධනය, සෑම දෙනාටම යුක්ති සඳහා ප්‍රවේශ වීම සහ සෑම තලයකම ඵලදායි, වගවීම සහ පුළුල් ආයතන ගොඩ නැගීම.
ඉලක්ක 17	ක්‍රියාත්මක කිරීමේ මාධ්‍යයන් ශක්තිමත් කිරීම සහ තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය හවුල්කාරිත්වය පූනර්ජීවනය කිරීම.

6 සමාලෝචනය

සමස්තයක් ලෙස ආයතනයේ සංයුක්ත සැලැස්මෙහි ඇති ඉලක්කයන් ගුණාත්මක අධ්‍යාපනයක් මගින් ශ්‍රී ලංකාවේ දැනුම්-ආර්ථිකය සඳහා බලපෑමක් ඇති කළ හැකි දායකත්වයක් දැක්වීමට ඉහළ පෙළේ මිනිස් සම්පත් සමූහයක් ලෙස දැනුම්-සේවා-කාණ්ඩ උත්පාදනය කිරීම පදනම් කොට ගෙන ඇත. තිරසර සංවර්ධන ඉලක්කයන්හි ප්‍රධාන ඉලක්කයක් වන සැමට ගුණත්වයෙන් යුත් අධ්‍යාපනයක් ලබා දීමේ වගකීම ඉතාමත් මැනෙවින් ආයතන සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම තුළින් ක්‍රමික වර්ධනයෙන් යුතුව ඉදිරියට ගෙන යාමට හැකි සියලුම ක්‍රියාමාර්ගයන් ගැනීමට ආයතනය යුහුසුළුව කටයුතු කරමින් සිටී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එවිඊබී/බී/අයිඑච්ආර්ඒ/2022එම්ඒ/05 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 ජූනි 23 දින

අධ්‍යක්ෂ,

මානව සම්පත් අභිවර්ධන ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

සහතික කරන ලද ගිණුම් සහ යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.හොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :-

1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය,
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.
3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.
4. උපකුලපති - කොළඹ විශ්වවිද්‍යාලය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } එච්ඊඩී/බී/අයිඑච්ආර්ඒ/2022එෆ්එම්/705

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2023 ජූනි 23 දින

අධ්‍යක්ෂ,
මානව සම්පත් අභිවර්ධන ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලියේ 23 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර අපේක්ෂිත වෙනස්වීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතුය එසේ වුවද සම්පූර්ණයෙන්ම ක්ෂය වූ නමුත් තවදුරටත් භාවිතා කරන පිරිවැය රු 5,041,834 ක් වූ පුස්තකාල පොත්, කාර්යාල උපකරණ, විදුලි උපකරණ සහ ගෘහභාණ්ඩ සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි

(ආ) සමාලෝචිත වර්ෂයේ පාඨමාලා ආදායමෙන් රු 73 960,254 ක් හා අයදුම්පත් ගාස්තු රු 722 800 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වර්ෂයේ ආදායම් ලෙස දැක්වීමකින් තොරව පිළිවෙලින් සංවර්ධන අරමුදලට හා විලම්භීත ආදායම් ගිණුමට බැර කර තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.74 683,054 කින්,අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර ඇති ස්ථාවර වත්කම් කාණ්ඩ දෙකක ප්‍රයෝජනවත් ජීවිත කාලය පදනම් කර නොගෙන වර්ෂයේ ක්ෂය ගණනය කිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු. 923,340කින් අධිගණනය වී තිබුණි

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී පුස්තකාල සංවර්ධන අරමුදලක් (Library Development Fund) ඇතිකර එම අරමුදලට 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ලැබී තිබුණු පුස්තකාල තැන්පතු (Student Library deposit) රු 2 073 000 ක් මාරු කර තිබුණ ද ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ

පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති (අ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සම්බන්ධවී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති / විධානයට යොමුව	නිරීක්ෂණය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(5)	ලබාගත් අතුරු අග්‍රිම කාර්යය අවසන් වී දින 10 ක් තුල පියවිය යුතු වුවත්, අවස්ථා 7 කදී ලබා ගත් එකතුව රු.345,600 ක් වූ අතුරු අග්‍රිම දින 11 සිට දින 50 ක් දක්වා කාලයක් අත රඳවාගෙන සම්පූර්ණ මුදලම නැවත පියවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) අරමුදල් පිහිටුවීමේ අරමුණු සඳහා උපයෝජනය කිරීමකින් තොරව සුබසාධන හා සමාජ වගකීම් අරමුදලේ රු.3,815,947 ක් වූ ශේෂය වර්ෂ දෙකක කාලයක සිට හා පුහුණු හා සංවර්ධන අරමුදලේ රු.1,252,313 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂය තුළ දී උපයෝජනය නොකර ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) වර්ෂ 03 ත් වර්ෂ 05 ත් අතර කාලයක සිට පවතින එකතුව රු.312,568 ක රඳවාගත් තැන්පතු (Retention) නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම				විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	ඉදිරිපත් කරන පිළිතුරු	2022 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය
1.			මූල්‍ය ප්‍රකාශන			
	1.2	(අ)	**තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර අපේක්ෂිත වෙනස්වීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතුය. එසේ වුවද, සම්පූර්ණයෙන්ම ක්ෂය වූ නමුත් තවදුරටත් භාවිතා කරන පිරිවැය රු. 5,041,834 ක් වූ පුස්තකාල පොත් කාර්යාල උපකරණ විදුලි උපකරණ සහ ගෘහභාණ්ඩ සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේදී ප්‍රතයාගණනය කිරීමට කටයුතු කරමි.	පුස්තකාල පොත් ඉදිරියේදී ප්‍රතයාගණනය කිරීමට කටයුතු කරමි.
		(ආ)		සමාලෝචිත වර්ෂයේ පාඨමාලා ආදායමෙන් රු. 73,960,254 ක් හා අයදුම්පත් ගාස්තු රු. 722,800 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වර්ෂයේ ආදායම් ලෙස දැක්මකින් තොරව පිළිවෙලින් සංවර්ධන අරමුදලට හා විලම්භීත ආදායම් ගිණුමට බැර කර තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.74,683,054 කින් අඩුවෙන් දක්වා තිබුණි.	ආයතනයේ පාඨමාලා අයවැයන් සකස් කරනු ලබන්නේ පාඨමාලාවන් සඳහා ලැබෙන සියලුම ආදායම් සලකා බැලීමෙන් පසු ඒ අනුව අදාල වියදම් වෙන් කිරීම ලෙසනි. එම නිසා පාඨමාලාවන් සඳහා ලැබෙන සියලුම ආදායම් පාඨමාලාවට අදාල ආදායම් ලෙස පමණක් සලකා බලයි. එසේ නොමැතිව අයඳුම්පත් ගාස්තුව සහ අනෙකුත් ගාස්තු වර්ෂයේ ආයතනයේ සාමාන්‍ය ආදායම ලෙස සැලකුවහොත් අදාල පාඨමාලාවේ වියදම් පියවා ගැනීමේදී එය ආදායමට වඩා වියදම් වැඩියෙන් කල පාඨමාලාවක් ලෙස ලෙජරය තුල පෙන්නුම්	අදායම් හඳුනාගැනීමේ ක්‍රමවේදය පැහැදිලිව ගිණුම්කරණ සටහන් හෙලිදරව් කිරීම තුල දැක්වීමට කටයුතු කර ඇත.

					කෙරේ. එම නිසා ආයතනයේ පාඨමාලා සඳහා ලැබෙන සියලුම ආදායම් පාඨමාලා ගාස්තු ලෙස සලකනු ලබයි. ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අයවැය සකස්කරනු ලබන ප්‍රතිපත්තිය අනුව සංවර්ධන අරමුදලට කරන ප්‍රතිපාදන අදාල පාඨමාලාවේ වියදමක් ලෙස හඳුනා ගනිමින් අයවැයන් සකස් කරයි. එම නිසා සංවර්ධන අරමුදලට කරන දායකත්වය අදාල පාඨමාලාව තුලින් සෘජුවම සංවර්ධන අරමුදලට බැර කිරීම සිදු කරනු ලබයි. ගිණුම් වර්ෂය සඳහා සංවර්ධන අරමුදලින් ආයතනයේ සාමාන්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ප්‍රමාණය පමණක් වර්ෂයේ ආදායම හා වියදම ලෙස හඳුනාගනු ලබයි. මෙය ආයතන හා පාඨමාලාවන් ස්වාධින ලෙස සලකා කටයුතු කරනු ලබන ප්‍රතිපත්තියකි. ආයතනය දැනට භාවිතා කරන ගිණුම්කරණ පද්ධතිය (2015 වර්ෂයේ සිට) තුල අයවැයන්ට අදාලව මෙම ක්‍රමය මත පිහිටා ගිණුම්කරණ කටයුතු සිදු කරනු ලබයි. කෙසේ වෙතත් මෙම සංවර්ධන අරමුදලට කරන මාරු කිරීම් ආයතනයේ සාමාන්‍ය ආදායමක් ලෙස සැලකිය නොහැකි අතර එය සෘජු ලෙසම සංවර්ධන අරමුදලේම ආදායමක් ලෙස සැලකිය යුතුය. මේ නිසා අදාල අගයෙන්	

					ලාභය අඩුවෙන් දැක්වේ යැයි කිව නොහැකිය.	
		(ඇ)		මුල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර ඇති ස්ථාවර වත්කම් කාණ්ඩ දෙකක ප්‍රයෝජනවත් ජීවිත කාලය පදනම කර නොගෙන වර්ෂයේ ක්ෂය ගණනය කිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.923,340 කින් අධිගණනය වී තිබුණි.	ක්ෂය ගණනය කිරීමේ ප්‍රතිපත්තිය තුල වත්කම් ආයතනයට මුලිකව මිලදි ගැනිමේදී හෝ ලැබීමේදී අනුගමනය කරන ක්ෂය අනුපාතයන් මුල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කර ඇති අතර එය එලෙසම ගණනය ද සිදු කරනු ලබයි. නමුත් මුලික හඳුනාගැනිමෙන් පසුව වත්කම් ප්‍රත්‍යගණනය සිදුකල පසු අදාල වත්කම් කාණ්ඩ වල විවිධ වත්කම් වර්ග වෙන වෙනම ප්‍රත්‍යගණනය කරන අතර එම වත්කම් වල ප්‍රයෝජනවත් ජීවන කාලය වෙනස්වීම සහ එම අගයන් සියල්ලම දැක්වීම අපහසුය.	ඉදිරී වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යගණනයේදි ජීවිත කාලය වෙනස් වීම් සමස්ථයක් වශයෙන් මුල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කිරිමට සටහන් කර ගන්නා ලදි.
		(ඈ)		සමාලෝචිත වර්ෂය තුළදී පුස්තකාල සංවර්ධන අරමුදලක් (Library Development Fund) ඇතිකර එම අරමුදලට 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී ලැබී තිබුණු පුස්තකාල තැන්පතු (Student Library deposit) රු.207,300 ක් මාරු කර තිබුණද ඒ සම්බන්ධයෙන් මුල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	පුස්තකාල තැන්පතු ලෙස ලැබී තිබුණු කිසිම මුදලක් වර්ෂය තුල දී පුස්තකාල සංවර්ධන අරමුදලට මාරු කර නොමැති අතර පුස්තකාල ගාස්තු ලෙස ලද මුදල් පමණක් එම ගිණුමට මාරු කර ඇත. එය ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුල පෙන්වා ඇත.	ගිණුම්කරණ හෙලිදරව් කිරීම් තුල තොරතුරු ඉදිරිපත්කිරීමට කටයුතු කර ඇත.
2.	2.2.2		**වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(5)	ලබාගත් අතුරු අග්‍රිම කාර්යය අවසන් වූ දින 10 ක් තුල පියවිය යුතු වුවත්, අවස්ථා 7 කදී ලබා ගත් එකතුව රු.345,600 ක් වූ අතුරු අග්‍රිම දින 11 සිට දින 50 ක් දක්වා කාලයක් අත රඳවාගෙන සම්පූර්ණ මුදලම නැවත පියවා තිබුණි.	අදාල අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරම්.	අත්තිකාරම් ලබාදුන් නිලධාරීන්ට එම අත්තිකාරම් ඉක්මනින් පියවීමට අදාලව උපදෙස් ලිපි ලබා දී ඇති අතර සම්පූර්ණ මුදල වියදම් නොකල අවස්ථාවේදී එයට හේතු ලිඛිතව ලබා දීමට ද උපදෙස් ලබා දී ඇත.

	2.3	(අ)	**<u>වෙනත් කරුණු</u>**	අරමුදල් පිහිටුවීමේ අරමුණු සඳහා උපයෝජනය කිරීමකින් තොරව සුබසාධන හා සමාජ වගකීම් අරමුදලේ රු. 3,815,947 ක් වූ ශේෂය වර්ෂ දෙකක කාලයක සිට හා පුහුණු හා සංවර්ධන අරමුදලේ රු. 1,252,313 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂය තුළ දී උපයේජනය නොකර ඌන උපයෝජිතව පැවතුණි.	දැනට රජයේ පවත්නා ව්‍යදම් සීමා කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තින් මත මෙම අරමුදල තුලින් අපේක්ෂිත අරමුණු සඳහා මුදල් යෙදවීම අපහසු වී ඇත.	දැනට රජයේ පවත්නා ව්‍යදමිසීමා කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තින් මත මෙම අරමුදල තුලින් අපේක්ෂිත අරමුණු සඳහා මුදල් යෙදවීම අපහසු වි ඇත.
		(ආ)		වර්ෂ 03 ත් වර්ෂ 05 ත් අතර කාලයක සිට පවතින එකතුව රු.312,568 ක රඳවාගත් තැන්පතු (Retemtion) නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	අදාල තැන්පතු නිරවුල් කිරීමට අවශ්‍යකාවයන් ඉටු නොවී ඇති නිසා නිරවුල් කර නොමැත. නිරවුල් කිරීමට හැකි තැන්පතු මෙම වර්ෂය තුලදී නිරවුල් කිරීමට කටයුතු කරමි.	නිරවුල් කිරීමේ අවශ්‍යකා ඉටුකර ඇති තැන්පතු නිරවුල් කර ඇත.